# වාර්ෂික වාර්තාව

# 2017

## <u>අපගේ දැක්ම</u>

නව ලොව සමඟ අනුගත

වෙමින්

කෘෂි ව්‍යවසායකයන් බිහි

කරන ජාත්‍යන්තර

තත්ත්වයේ

තාක්ෂණ විශ්ව විද්‍යාලයක්

බවට පත්වීම.

## <u>අපගේ මෙහෙවර</u>

**ශ්‍රී ලංකාවේ දැනුමින් සපිරි කෘෂි ආර්ථිකයක් බිහි කිරීම සඳහා තාක්ෂණය සහ ග්‍රාමීය විද්‍යාවන් භාවිතා කරමින් ව්‍යවසායකත්වය අරමුණු කරගත් උපාධිධාරීන් සහ මානව සම්පත් බිහි කිරීම.**

**අධ්‍යක්ෂවරයාගේ පණිවිඩය:**

ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන්ම කෘෂිකාර්මික රටක් වන අතර ග්‍රාමීය ජනතාවගෙන් බහුතරයක්ම තම ජීවිකාව ලෙස ගොවිතැනෙහි යෙදී සිටී. එසේ වුවද, කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ ඵලදායිතාව අඩු වීම හා වාණිජ මට්ටමින් අගය එකතු කළ කෘෂිකාර්මික නිෂ්පාදන කෙරෙහි දක්වන නැඹුරුතාව අඩු වීම හේතුවෙන් අද දක්වාම දේශීය අවශ්‍යතා සපුරාලීම සඳහා ආනයනික ආහාර මත යැපීමට ශ්‍රී ලංකාවට සිදුව තිබේ. මෙම තත්ත්වය කෙරෙහි බලපාන ප්‍රධාන සාධකවලින් එකක් වන්නේ පාර්ශ්වකාර දාමය තුළ විශේෂයෙන් ගොවි ප්‍රජාව තුළ පවත්නා දැනුම් පරතරය යි.

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ (UCIARS) දැක්ම වන්නේ අවබෝධය හා අධ්‍යාපනය ඉහළ නැංවීම තුළින් ගොවි ප්‍රජාව වැඩි දියුණු කොට දැනුම් පරතරය ඵලදායී අන්දමින් පියවීමත්, කෘෂිකාර්මික නිෂ්පාදනය තුළින් ස්වයංපෝෂිතභාවයට මං පෙත් විවර කරන්නා වූ දැනුම් හැකියාව හුවමාරු කරගැනීමේ සංසදයක් නිර්මාණය කිරීමත් ය.

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය (UCIARS) යනු පවත්නා රාමුවෙන් ඔබ්බට ගොස් කටයුතු කරන ශ්‍රී ලංකාවේ පළමු වැනි ආයතනය වන අතර එමගින් මෙරට කෘෂි ව්‍යවසායකයින් සඳහා ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා සහ කෘෂි තාක්ෂණි උපාධි පිරිනමනු ලැබේ. ශ්‍රී ලංකාවේ විශ්ව විශ්ව විද්‍යාල තුළ පවත්නා සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය අභිබවා කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය (UCIARS) මගින් පිරිනමනු ලබන අන්තර් ජාලගත පාඨමාලා කෙරෙහි වර්තමානයේ විශේෂ අවධානයක් යොමු වී ඇති අතර කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ පවත්නා දැනුම් පරතරය අවම කිරීමට මෙන්ම කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ තිරසාර බව ස්ථාපිත කිරීම සඳහා ද එය මනා රුකුලක් වී තිබේ.

ගොවිපල ඵලදායීතාව ඉහළ නැංවීමේ අරමුණින් කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය (UCIARS) මගින් උසස් තත්ත්වයේ පටක රෝපිත කෙසෙල් පැළ හා වෙනත් රෝපණ ද්‍රව්‍ය ගොවි ප්‍රජාව වෙත සපය යි. කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ (UCIARS) තවත් සුවිශේෂී නවෝත්පාදනයක් වනුයේ දරිද්‍රතාව තුරන් කිරීමේ රජයේ වැඩසටහන ශක්තිමත් කරමින් අපනයනය කිරීමේ අරමුණින් අඹ ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික යෙදවුම් (Tom-EJC) හඳුන්වා දීම යි.

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ (UCIARS) අධ්‍යක්ෂ ලෙස 'පළමුව ගුණාත්මකභාවය' යන ආදර්ශ පාඨය අනුගමනය කරමින් අප තැබූ සෑම පියවරකදී ම අපගේ උපකුලපතිවරයා විසින් ලබා දුන් විශිෂ්ඨ සහයෝගය සහ මාර්ගෝපදේශනය සිහිපත් කරමින් මගේ හෘදයාංගම කෘතඥතාව එතුමා වෙත පුද කර සිටිමි. කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ (UCIARS) අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා නන් අයුරින් සහයෝගය දැක්වූ සියළු දෙනා වෙත ද මගේ ස්තුතිය පිරිනම මි.

මහාචාර්ය එස්.සුභසිංහ
කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි-තාක්‍ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය
අධ්‍යක්ෂ

## ඉලක්ක සහ අරමුණු

**1. ආයතනය මඟින් ගොවි ප්‍රජාව වෙත පිරිනමනු ලබන ඩිප්ලෝමා පාඨමාලා, උසස් ඩිප්ලෝමා පාඨමාලා සහ උපාධි පාඨමාලාවන්හි ගුණාත්මක බව සහ ප්‍රමාණාත්මක බව ඉහළ නැංවීම.**

අරමුණු අංක 1.1 : වාර්ෂික බඳවා ගැනීම් ඉහළ නැංවීම තුළින් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම.
අරමුණු අංක 1.2 : ඉලක්ක ගත කණ්ඩායම් අතර අධ්‍යයන වැඩසටහන් ප්‍රචලිත කිරීම.
අරමුණු අංක 1.3 : දමිළ සහ මුස්ලිම් ගොවි ප්‍රජාව වෙත අධ්‍යයන වැඩසටහන හඳුන්වා දීම.
අරමුණු අංක 1.4 : අත්‍යවශ්‍ය මානව සම්පත් සංවර්ධනය කිරීම.
අරමුණු අංක 1.5 : අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සැපයීම
අරමුණු අංක 1.6 : විදේශ විශ්ව විද්‍යාල සමඟ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
අරමුණු අංක 1.7 : අධ්‍යයන වැඩසටහනේ ගුණාත්මය සහ ප්‍රමාණාත්මක බව ඉහල නැංවීම සඳහා පර්යේෂණ සිදු කිරීම.

**2. පටක රෝපිත කෙසෙල් පැළ නිෂ්පාදනය ඉහළ නැංවීම සහ ආයතනයේ හා ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම.**

අරමුණු අංක 2.1 : පවත්නා නිෂ්පාදන අනුපාතය ඉහළ නැංවීම තුළින් 2018 වර්ෂය වන විට ස්වයං පෝෂිත තත්ත්වයට පත්වීම.
අරමුණු අංක 2.2 : පැළ නිෂ්පාදනය කිරීමේ දී , ඇසිරීමේ දී සහ ප්‍රවාහනය කිරීමේ දී ගෝලීය ප්‍රශස්ත පරිචයන් අනුගමනය කිරීම.
අරමුණු අංක 2.3 : පටක රෝපණ පැළ නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා පර්යේෂණ පැවැත්වීම.

**3. ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ 2021 වර්ෂය වන විට අධ්‍යයන වැඩසටහන් තුළින් බිහි වන කෘෂි ව්‍යවසායකයින්ගේ සංඛ්‍යාව ඉහළ නැංවීම.**

අරමුණු අංක 3.1 : ආයතනය මඟින් බිහිකරනු ලබන ව්‍යවසායකයින් සංඛ්‍යාව ඉහළ නැංවීම.
අරමුණු අංක 3.2 : ජාතික ආර්ථිකයට වැඩි දායකත්වයක් ලබා දිය හැකි ඵලදායී සහ දක්ෂ ව්‍යවසායකයින් බිහි කිරීම.

**4. ශ්‍රී ලංකාවේ ශීඝ්‍රයෙන් සංවර්ධනය වන ප්‍රදේශ සඳහා ඍජු අධ්‍යයන යෙදවුම් ලබා දීම**

අරමුණු අංක 4.1 : නව තාක්ෂණික අධ්‍යයන වැඩසටහන් පිරිනැමීම.
අරමුණු අංක 4.2 : කෘෂි පාරිසරික ක්‍රියාකාරකම් සංවර්ධනය සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීම.
අරමුණු අංක 4.3 : අවට ප්‍රදේශවල වෙසෙන ජනතාවගේ යහපත උදෙසා ප්‍රජා සේවා ලබා දීමේ දී පහසුකම් සපයන්නකු ලෙස කටයුතු කිරීම.
අරමුණු අංක 4.4 : සමාජ වගකීම් ඉටු කිරීම.

**5. හිතකර භෞතික හා සමාජයීය පරිසරයක් ඇති කිරීම**

අරමුණු අංක 5.1 : හිතකර භෞතික හා සමාජයීය පරිසරයක් නිර්මාණය කිරීම

**2017 වසරේ විශේෂ සිදුවීම්**

1. 2017.08.01 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති උපාධි ප්‍රධානෝත්සවයේ දී ආයතනයේ සිසුන් නව (09) දෙනකු සඳහා කෘෂි තාක්ෂණවේදී උපාධිය පිරිනමන ලදී. මෙය ආයතනය සඳහා ඉතාමත් සුවිශේෂී සහ ඓතිහාසික මෙන්ම අභිමානවත් අවස්ථාවකි.

2. ආයතනයේ පළමු ස්ථිර අධ්‍යක්ෂවරයා වන එම්.ඩී.පියතිලක මහතාගේ වසර 03ක සේවා කාලය අවසන් වීමෙන් පසුව දෙවැනි ස්ථිර අධ්‍යක්ෂවරයා ලෙස 2017.07.03 දින සිට මහාචාර්ය එස්.සුබසිංහ මහතා පත්වීම.

3. 2017.01.31 දින වැල්ලවායේ සුහද කොන්ත්‍රාත් ආයතනය විසින් ආයතනයේ නව පරිපාලන ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු අවසන් කොට ආයතනය වෙත භාර දී ඇත.

4. කොළඹ විශ්ව විද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ විද්‍යා පීඨයේ පීඨාධිපති මහාචාර්ය රන්ජිත් මහානාම සහ මෙම ආයතනයේ අධ්‍යක්‍ෂතුමාගේ සහභාගීත්වයෙන්, 2017.08.22 දින කළමනාකරණ මණ්ඩල රැස්වීම්කාමරයකින් ද සමන්විත ආයතයේ නව පරිපාලන ගොඩනැගිල්ල උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

5. ආයතනයේ නව දේශනාගාරය, විභාග ශාලාව සහ විද්‍යාගාරය සහිත ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා 2017.08.02 දින හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්, ඩබ්.එම්.කරුණාරත්න මහතා විසින් මුල්ගල තබන ලදී.

6. පටක රෝපණ විද්‍යාගාරය සඳහා නව තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු, කලගෙඩිහේනේ කේ.එස්.ජේ. කොන්ත්‍රාත් සමාගම විසින් 2017 ජුනි මාසයේදී ආරම්භ කරන ලදී.

7. ආයතනයේ දැනට පවතින පැළ තවාන් ඒකකය පුනරුත්ථාපනය හා දීර්ඝ කිරීමේ කටයුතු 2017 වර්ෂය තුල දී සිදු කරන ලදී.

8. පොලිතීන් ආහාර දවටන (lunch sheet) සඳහා ආදේශකයක් ලෙස, සකස් කරන ලද (cured) කෙසෙල් කොළ භාවිතයෙන් ජෛව ආහාර දවටන (Bio food wrappers) නිෂ්පාදනය සහ ජෛව තැටි (Bio plates) ලෙස පිරිසැකසුම් කිරීමේ තාක්ෂණය, ආයතනය විසින් හඳුන්වා දෙන ලදී. එසේම ජෛව ආහාර දවටන සකස් කරන ආකාරය පිළිබඳ පුහුණු වැඩසටහන් ගණනාවක් විවිධ බාහිර ආයතන වල දී පවත්වන ලදී. මෙම තාක්ෂණය ප්‍රචලිත කිරීම සඳහා රුහුණු සේවය සහ නෙත් FM ගුවන් විදුලි නාලිකා වල සජීවී ගුවන් විදුලි වැඩසටහන් පටිගත කිරීම, ජාතික පුවත්පත් කිහිපයක පුවත්පත් වාර්තා පළ කිරීම සහ දෙරණ රූපවාහිනී මාධ්‍ය ජාලයේ රූපවාහිනී වැඩසටහන් පටිගත කිරීම යනාදිය සිදු කරන ලදී.

9. ආයතනයේ ශිෂ්‍යයින්ගේ විෂය බාහිර ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා සියලුම ශිෂ්‍ය කණ්ඩායම් වල මැදිහත් වීමෙන් 2017 සැප්තැම්බර් මස 15, 16 සහ 17 දින වල දී ක්‍රීඩා උළෙලක් (Sports meet) පවත්වා ඇත.

10. හම්බන්තොට දිස්ත්‍රික්කයේ සාමාජිකයින් 42 නකුගෙන් සමන්විත වූ බිම්මල් වගාකරන්නන්ගේ සංගමයක් ආයතනයේ ස්ථාපිත කිරීම.

11. ගොවි ප්‍රජාවගේ දැනුම, ඉගෙනුම හා කුසලතා වර්ධනය සඳහා, විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශයේ සහ කැනඩාවේ කොමන් වෙල්ත් ඔෆ් ලර්නින්ග් (Common wealth of learning) සමඟ, L3F (life long learning for farmers) ව්‍යාපෘතිය ආරම්භ කිරීම.

12. ආයතනයේ සුහසාධක සංගමයේ ආපනශාලාව ස්ථාපිත කිරීම හා සාර්ථකව ක්‍රියාත්මක වීම.

13. ආයතනයේ ගුණාත්වය සහතික කිරීමේ කවය (Quality Assurance Cell) ස්ථාපිත කිරීම.

14. ආයතනයේ පර්යේෂණ කළමනාකරණ කමිටුව (Research Management Committee ) ස්ථාපිත කිරීම.

15. කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය පරිවර්තනය කරමින් වාණිජ කෘෂි විද්‍යා පීඨය ඉදි කිරීමේ ක්‍රියාවලිය සඳහා, උනන්දුවක් දක්වන පාර්ශවයන් (Stake Holders) සමඟ රැස්වීමක් 2017 නොවැම්බර් 23 දින විද්‍යාල මන්දිරයේ දී පවත්වන ලදී.

16. ආයතනය විසින් ක්ෂණික කරපිංචා කැඳ මිශ්‍රණය (තලපය) නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය ව්‍යාප්ත කිරීම සිදු කර ඇති අතර තරුණ ප්‍රජාව විසින් මෙම තාක්ෂණය සාර්ථකව භාවිතා කරමින් වාණිජමය මට්ටමින් ස්වයං රැකියාවක් ලෙස මෙය නිෂ්පාදනය කරමින් සිටී.

**2017 වසරේ කෘෂි තාක්ෂණික අධ්‍යයන අංශය තුළ සිදු වූ විශේෂ සිදුවීම්**

| | |
|---|---|
| ශිෂ්‍ය ලියාපදිංචිය | • කෘෂි තාක්ෂණික උපාධිය දක්වා හැදෑරිය හැකි කෘෂි තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා කෘෂි ව්‍යවසායකයින් 108 දෙනකු 8 වැනි ශිෂ්‍ය කණ්ඩායම ලෙස බඳවා ගෙන අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී.<br>• 2017 වර්ෂය සඳහා 9 වැනි ශිෂ්‍ය කණ්ඩායම බඳවා ගැනීම සඳහා දැන්වීම් පළ කර ඇත. |
| විෂය මාලාව සැලසුම් කිරීම සහ සංවර්ධනය | • මහාචාර්ය උදිත් ජයසිංහ මැතිතුමාගේ මහපෙන්වීම මත වයඹ විශ්ව විද්‍යාලයීය කණ්ඩායමකගේ සහයෝගය ඇතිව 2016 වර්ෂය අවසාන වන විට විෂය නිර්දේශය සංශෝධනය සිදු කරන ලද අතර එය 2017 වර්ෂයේ දී සනාථන සහා අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. |
| ඉගැන්වීම සහ ඉගෙනුම | • රජයේ විශ්ව විද්‍යාලවල ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්ගේ සහභාගීත්වයෙන් විවිධ මොඩියුල යටතේ බාහිර දේශන 10 ක් පමණ පවත්වා තිබේ.<br>• විවිධ ක්ෂේත්‍ර යටතේ ක්ෂේත්‍ර චාරිකා 13 ක් පමණ සාර්ථකව සම්පූර්ණ කර ඇත.<br>• සෑම සහතික පත්‍ර පාඨමාලාවක් සඳහාම නියමිත ප්‍රායෝගික පන්ති, කණ්ඩායම් ඉදිරිපත් කිරීම් (presentations), ප්‍රහේළිකා සහ පැවරුම් සියල්ල පවත්වා ඇති අතර පන්ති කාමර ඉගැන්වීම්වල දී සිදු කළ යුතු අනිවාර්ය අතිරේකයන් සහ මූලික කොටස් ද අවසන් කර ඇත. |

| | |
|---|---|
| ඉගෙනුම් සම්පත්, ශිෂ්‍ය අනුග්‍රහය සහ ප්‍රගතිය. | • ගොවිපල පුහුණුව පාඨමාලාව යටතේ ක්ෂේත්‍ර කටයුතු සඳහා ගොවිපල භූමියක් සංවර්ධනය කෙරෙමින් පවතී.<br>• බෝග වගාව පාඨමාලාව යටතේ වී වගාව සම්බන්ධ ප්‍රායෝගික ක්‍රියාකා රකම් සඳහා කුඹුරක් බද්දට ගන්නා ලදී.<br>• ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සඳහා අතිරේක වාර්මාර්ග ප්‍රවේශ මේ වන විටත් ආරම්භ කර එය ක්‍රියාත්මක කරමින් පවතී. ආහාර තාක්ෂණ පාඨමාලාව යටතේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා යොදා ගත හැකි ආහාර වියළන යන්ත්‍රයක් ශ්‍රී ලංකා තිරසාර බලශක්ති අධිකාරිය මගින් පරිත්‍යාග කර තිබේ. ශිෂ්‍ය සුබසාධනය උදෙසා අධ්‍යයන උපදේශන ඒකකයක් ආරම්භ කර ඇති අතර පළපුරුදු කාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනකු වන එස්.ඒ.පී. නෙල්කා මහත්මිය සහ එච්. රෝහණධීර මහතා මෙහි ශිෂ්‍ය උපදේශකවරුන් ලෙස පත් කර තිබේ.<br>• රසායනාගාරයක්, දේශන ශාලා සහ පුස්තකාලයක් ස්ථාපිත කිරීම අර්ධ වශයෙන් නිම කර ඇති අතර ඒවා දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.<br>• ශිෂ්‍ය අනුගත කිරීමේ වැඩසටහන් (orientation programmes) ඵලදායීව සහ කාර්යක්ෂමව පැවැත්වීමේ අරමුණින් යුතුව පරිගණක වැඩි සංඛ්‍යාවක් යොදා ගනිමින් පරිගණක ඒකකය වැඩි දියුණු කිරීමට පියවර ගෙන තිබේ. |
| කාර්ය මණ්ඩල ශක්‍යතාව හා ගුණාත්මක බව | • කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක පාසලේ පැවති මිශ්‍ර අධ්‍යාපන ක්‍රමවේදය (Blended learning) පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා අධ්‍යයන කාර්යමණ්ඩලයේ සාමාජිකයින් 03 දෙනකු සහභාගී විය. |
| පර්යේෂණ | • උපාධි අපේක්ෂක පර්යේෂණ යටතේ පර්යේෂණ 20 ක් පමණ සිදු කර තිබේ. |

## පටුන

පිටු අංක

1. සමාලෝචනය

1.1 හැඳින්වීම 01

1.2 කළමනාකරණ මණ්ඩලය 01

1.3 කළමනාකරණ මණ්ඩල රැස්වීම් 02

1.4 විගණන කමිටුව 03

1.5 සංවිධාන ව්‍යූහය 04

2. සමස්ත කාර්යසාධනය 05

2.1 අධ්‍යයන වැඩසටහන් කාර්යසාධනය 07

2.2 RED වැඩසටහනේ කාර්යසාධනය 12

2.3 පැළ තවාන්/ විද්‍යාගාර කාර්යසාධනය 14

3. පර්යේෂණ සහ නවෝත්පාදන 23

4. පුහුණු, වැඩමුළු සහ කාර්ය මණ්ඩල සංවර්ධනය 24

5. නවීකරණය කිරීම් සහ ඉදිකිරීම් ව්‍යාපෘති 25

6. මූල්‍ය 26

පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

ව්‍යාපෘති වියදම් පිළිබඳ (දේශීය/විදේශීය අරමුදල් සපයන) විස්තර

මූල්‍ය ප්‍රගතිය (ඉපැයූ ආදායම) පිළිබඳ විස්තර

2017 මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය

2017 වර්ෂය තුළ ලැබුණු යටිතල පහසුකම් පිළිබඳ විස්තර

2017 මූල්‍ය ප්‍රකාශන

2017 විගණකාධිපති වාර්තාව

2017 විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

## 1. සමාලෝචනය

### 1.1 හැඳින්වීම

මෙම ආයතනය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2000 වර්ෂයේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ කොට හම්බන්තොට වැලිගත්ත ප්‍රදේශයේ මාගම්පුර කෘෂි තාක්‍ෂණ හා ප්‍රජා සේවා මධ්‍යස්ථානය ලෙස ප්‍රථමයෙන් ස්ථාපනය කර ඇත. මෙම මධ්‍යස්ථානය 1998 වසර තරම් ඈතක දිගු ඉතිහාසයකට හිමිකම් කියන අතර විශ්ව විද්‍යාල පර්යේෂකයන් මෙම කාලය පුරා ප්‍රජාව සමග සම්බන්ධව, ඔවුන්ට තාක්ෂණය සහ දැනුම ලබා දීම සහ කලාපයේ කෘෂි කර්මය හා කෘෂි කර්මාන්තයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා සහයෝගයෙන් කටයුතු කර ඇත. මෙම ආයතනයේ නිර්මාතෘ වන්නේ කොළඹ විශ්ව විද්‍යාලයේ හිටපු උපකුලපතිනි සහ හිටපු විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිනී වන මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම මැතිණිය යි.

1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 24 'අ' වගන්තිය සහ 2008 අංක 02 දරණ කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්‍ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලිය යටතේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස කොළඹ විශ්ව විද්‍යාලීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය ස්ථාපිත කරන ලදී. මෙම නියමාවලිය 2008 අගෝස්තු මස 23 වැනි දින සිට බලාත්මක වන්නේය.

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය, කෘෂි තාක්ෂණ උපාධිය දක්වා දීර්ඝ කල හැකි ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා පාඨමාලා පවත්වාගෙන යනු ලබයි. කොළඹ විශ්ව විද්‍යාලීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන මෙම සියලු පාඨමාලා ගොවි ප්‍රජාව තුළ අධ්‍යයන පරිසරයක් නිර්මාණය කිරීමේ ප්‍රධාන බාධා වන වයස, ඉඩ ප්‍රස්ථාව, කාලය සහ අධ්‍යයන පරිසරය යන සාධක මඟ හරවමින් සාර්ථකව දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය යටතේ ඉහත කී අධ්‍යාපන අවස්ථාවන් ලබා දීමට කටයුතු කර ඇත. මෙම ආයතනය කෘෂි තාක්ෂණය හා ග්‍රාමීය විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනය ලබාදීම තුළින්, වර්තමානයේ කෘෂි තාක්ෂණය සහ කෘෂි කර්මාන්තය පිළිබඳ ව ප්‍රජාව අතර ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සිදුකර ඇත. එය ගොවි ප්‍රජාවගේ උසස් අධ්‍යාපනයට දොරටු විවෘත කිරීමේ සිහිනය සැබෑ කරමින් ඔවුන්ගේ නිවසටම දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය ඔස්සේ අධ්‍යාපනය ගෙන යමින් පුද්ගල වෙනස්කම් සිදු කිරීමට හා සමාජීය අවශ්‍යතා ඉටු කිරීමට සමත් වන්නේය. නමුත් ඔවුන්ගේ උසස් අධ්‍යාපනයට ඇති කැමැත්ත හෝ බලාපොරොත්තුව ඔවුන්ගේ පෞද්ගලික, ආර්ථික හෝ පවුල් පසුබිම හේතුවෙන් ගිලිහී යන අවස්ථාවන් දක්නට ඇත. මෙම ආයතනය ක්‍රියාත්මක කරන පාඨමාලා තෝරා ගැනීමට හා ඒවාට ප්‍රවේශ වීමේ නම්‍යශීලීත්වය නිසා දුප්පත් ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ වැඩිදුර අධ්‍යාපනය ලබන්නන්ට, නවීණ තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිත කරමින් ඔවුන්ගේ අධ්‍යාපන යථාර්තය හා වෘත්තීය සමාජ අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම සඳහා සුදුසු තෝතැන්නක් බවට පත්කර ඇත.

එපමණක් නොව මෙම ආයතනය විවිධ වැඩසටහන්වලට අමතරව ඉතාමත් සාධාරණ මිලකට දේශීය ගොවි ප්‍රජාවට පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදන ලබා දීමට කටයුතු කරමින් ආයතනයේ ආදායම් උත්පාදනය කිරීමට ද සමත් වී ඇත. මේ වන විට පටක රෝපණ විද්‍යාගාර 03 ක් සහ ප්‍රධාන දැල් ගෘහ 03 ක් ඉදිකර ඇත. සෑම මසකම, සියළුම විද්‍යාගාර භාවිත කරමින් පටක රෝපණ කෙසෙල් පැළ 22,000 පමණ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන අතර ඒ තුළින් ගොවි ව්‍යවසායකයින් 6,500 කට පමණ පහසුකම් සපයා ඇත. මෙම ආයතනය දිවයින පුරා විසිරී සිටින ග්‍රාමීය ගොවි ජනතාවට පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය සමබන්ධයෙන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු සහ සම්මන්ත්‍රණ විශාල ප්‍රමාණයක් පවත්වා ඇත. එසේම ග්‍රාමීය විද්‍යාවන්ට සම්බන්ධ නව තාක්ෂණය ගැන ගොවි ජනතාව දැනුවත් කිරීම සඳහා එම සම්පත් භාවිත කරමින් විවධ ජාතික මට්ටමේ ප්‍රදර්ශන සඳහා සහභාගී වී ඇත.

### 1.2 කළමනාකරණ මණ්ඩලය

2008 අංක 02 දරණ කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලියේ 05 වන වගන්තිය ප්‍රකාරව කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය තම කළමනාකරණ මණ්ඩලය පිහිටුවා ඇති අතර උක්ත නියමාවලියේ 10 වගන්තිය ප්‍රකාරව එකී

කළමනාකරණ මණ්ඩලය, ආයතනයේ අධ්‍යයන සහ විධායක මණ්ඩලය වන අතර එය පහත සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

නිළ බලයෙන් පත්වන සාමාජිකයින් 05 කි.

(අ). අධ්‍යක්ෂ , සභාපති වියයුතුය.
(ආ). නියෝජ්‍ය අධ්‍යක්ෂ
(ඇ). උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ලේකම් හෝ විෂයභාර ලේකම් හෝ එකී අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන විෂය සම්බන්ධයෙන් නම් කරන ලද සාමාජිකයෙකු
(ඈ). කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ලේකම් හෝ එකී අමාත්‍යාංශය විසින් නම් කරන ලද සාමාජිකයෙකු සහ
(ඉ). විශ්ව විද්‍යාලයේ විද්‍යා අධ්‍යනාංශයේ පීඨාධිපති

අනෙකුත් සාමාජිකයින් 06 කි.

(අ). කෘෂි ව්‍යාපාර කර්මාන්ත හා කෘෂි තාක්ෂණය නියෝජනය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් පත්කරන සාමාජිකයින් දෙදෙනෙක්
(ආ). පාලක සභාවේ සාමාජිකයින් අතරින් පත්කරගන්නා සාමාජිකයින් දෙදෙනෙක්,
(ඇ). හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් හෝ ඔහු විසින් නම් කරන ලද සාමාජිකයෙකු, සහ
(ඈ). ශාස්ත්‍රීය මණ්ඩලයේ සාමාජිකයන් අතරින් පත්කර ගන්නා සාමාජිකයෙකු වශයෙන් වේ.

## 1.3 කළමනාකරණ මණ්ඩල රැස්වීම්

ආයතනයේ කළමනාකරණ මණ්ඩලය, අධ්‍යයන සහ පරිපාලන කරුණු පිළිබඳව සමාලෝචනය කිරීම සඳහා වසර තුළ දී විධිමත්ව රැස්වී ඇත. කළමනාකරණ මණ්ඩලය 2017 වසර තුළ දස වරක් (10) රැස් වී ඇත.

**වගු අංක 01: 2017 වර්ෂයේ කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය**

| | | |
|---|---|---|
| **නිල බලයෙන් පත්වූ සාමාජිකයින් (නියමාවලියේ දක්වා ඇති පරිදි)** | | |
| | අධ්‍යක්ෂ- සභාපති | මහාචාර්ය කේ.ආර්.ආර්. මහානාම වැඩබලන අධ්‍යක්ෂ (2017/07/02 දක්වා)<br>මහාචාර්ය එස් සුභසිංහ<br>අධ්‍යක්ෂ (2017/07/03 සිට මේ දක්වා) |
| | උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නම් කළ තැනැත්තා | ඒ.එස්.පී. වීරසූරිය මහත්මිය<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් |
| | කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් නම් කළ තැනැත්තා | ආචාර්ය ජේ.ඩී.එච්. විජේවර්ධන (2017/03/09 දක්වා )<br>අධ්‍යක්ෂ (කාබනික පොහොර අංශය) |
| | විද්‍යා පීඨයේ පීඨාධිපති/ කොළඹ විශ්ව විද්‍යාලය | මහාචාර්ය කේ.ආර්.ආර්. මහානාම |
| **අනිකුත් සාමාජිකයින් (නියමාවලියේ දක්වා ඇති පරිදි)** | | |
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නම් කළ සාමාජිකයින් | මහාචාර්ය තාරා ද සිල්වා<br>පැලෑටි අධ්‍යයන අංශයේ මහාචාර්ය, කොළඹ විශ්ව විද්‍යාලය |

| | | |
|---|---|---|
| | | ක්‍රිෂාන්ති වීරසිංහ මහත්මිය (2017/07/27 දක්වා)<br>ප්‍රධාන විධායක නිළධාරී, හම්බන්තොට දිස්ත්‍රික් වාණිජ මණ්ඩලය.<br><br>මහාචාර්ය සමන් අබේසිංහ (2017/07/28 සිට මේ දක්වා)<br>උද්භිද විද්‍යා අධ්‍යයන අංශය, රුහුණ විශ්ව විද්‍යාලය. |
| | පාලක මණ්ඩලයේ නියෝජිතයන් | රජන් ආශිර්වාදන් මහතා<br>සභාපති, දංකොටුව පෝසිලේන් සමාගම |
| | | මහාචාර්ය ලක්ෂ්මන් රත්නායක මහතා<br>අධ්‍යක්‍ෂ, SLIIT |
| | දිස්ත්‍රික් ලේකම්/ හම්බන්තොට | ඩබ්.එච්. කරුණාරත්න මහතා |
| **ලේකම්** | | |
| | සහකාර ලේඛකාධිකාරී | එස්.ඒ.එස්. ප්‍රියදර්ශනී මහත්මිය |

**1.4 විගණන කමිටුව**

ආයතනයේ විගණන කමිටුව සෑම වර්ෂයකම කාර්තුමය වශයෙන් රැස් වේ. 2017 වර්ෂය තුල විගණන කමිටුව 4 වරක් රැස් වී ඇත.

2017 වර්ෂය තුල විගණන කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

| | |
|---|---|
| රජන් ආශිර්වාදන් මහතා | සභාපති/පාලක සභාව නම් කරන ලද |
| කේ.ඊ.ඩබ්.ජයසිරි මහතා | ලේකම්, ජ්‍යෙෂ්ඨ අභ්‍යන්තර විගණක, කොළඹ විශ්ව විද්‍යාලය |
| ඒ.එස්.පී.වීරසූරිය මිය | කළමනාකරණ මණ්ඩලයෙන් නම් කරන ලද, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය |
| මහාචාර්ය කේ.ආර්.ආර්.මහානාම | වැඩබලන අධ්‍යක්ෂ/UCIARS (2017.07.02 දක්වා), පීඨාධිපති, විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය, කළමනාකරණ මණ්ඩලයෙන් නම් කරන ලද |
| ඩබ්.ජී.එන්.අබේවික්‍රම මහතා | භාණ්ඩාගාරයේ නියෝජිත, ප්‍රධාන ගණකාධිකාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට |
| ඩබ්.ඒ.ටී.ජී. වීරක්කොඩි මිය | විගණන අධිකාරී, රජයේ විගණන අංශය, කොළඹ විශ්ව විද්‍යාලය |
| එම්.එම්.ජේ.ආර්. බෝගමුව | අභ්‍යන්තර විගණක, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම |
| කේ.එස්.ටී.එස්.ජයසූරිය මිය | මූල්‍යාධිකාරී, කොළඹ විශ්ව විද්‍යාලය |
| මහාචාර්ය එස්.සුබසිංහ | අධ්‍යක්ෂ/ UCIARS (2017.07.03 සිට) |
| ඒ.ඒ.එස්.චින්තනී මෙය | සහකාර මූල්‍යාධිකාරී/UCIARS (2017.08.15 දක්වා) |
| යූ.එල්.අබේසූරිය මහතා | වැඩබලන සහකාර මූල්‍යාධිකාරී/UCIARS (2017.08.15 න් පසුව) |
| එස්.ඒ.එස්.ප්‍රියදර්ශනී | සහකාර ලේඛකාධිකාරී/UCIARS |

**1.5 සංවිධාන ව්‍යුහය**



කළමනාකරණ මණ්ඩලය
ශාස්ත්‍රීය මණ්ඩලය
අධ්‍යක්ෂ
කොළඹ විශ්ව විද්‍යාලයේ සනාථන සභාවේ සාමාජිකයෙකි
පරිපාලන අංශය
මුදල් අංශය
අධ්‍යයන දෙපාර්තමේන්තු
අධ්‍යයන මණ්ඩලය
මධ්‍යස්ථාන
කෘෂි-තාක්ෂණය
ආහාර- තාක්ෂණය
ව්‍යවසායකත්ව කෘෂි-ව්‍යාපාර හා ග්‍රාමීය විද්‍යාවන්
පර්යේෂණ හා උසස් උපාධි
අභ්‍යන්තර අධ්‍යයන වැඩසටහන්
බාහිර සහ ව්‍යාප්ති වැඩසටහන්
කෘෂි ව්‍යාපාර සහ කර්මාන්ත කවය
විද්‍යා උයන
ව්‍යාප්ති වැඩසටහන්

## 2. සමස්ත කාර්යසාධනය

ආයතනයේ ප්‍රමුඛ කාර්යභාරය වනුයේ අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදනය සහ ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන (RED) වැඩසටහන් වල නිරත වීමයි. මීට අමතරව, සමාජ අවශ්‍යතා හඳුනාගනිමින් සමාජ සත්කාරයක් ලෙස ගොවිතැන් කටයුතු හා අගය එකතු කළ කෙසෙල් වගා නිෂ්පාදන සම්බන්ධයෙන් නව තාක්ෂණය පිළිබඳව ග්‍රාමීය ගොවීන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් ආයතනය විසින් පවත්වන ලදී.

2017 වර්ෂය තුළ දී ආයතනයේ අධ්‍යයන අංශය (කෘෂි තාක්ෂණික අධ්‍යයන අංශය) හරහා අධ්‍යයන ක්‍රියාකාරකම් ද පැළ තවාන් හා විද්‍යාගාර භාවිතයෙන් පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදනය ද සිදුකරන ලදී.

64 දෙනකුගෙන් යුතු කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව ආයතනය සිය ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට කටයුතු කරන ලදී. කාර්ය මණ්ඩලයෙන් 5% ක් පරිපාලන කටයුතු, 3% ක් අධ්‍යයන (ස්ථිර), 14% ක් අධ්‍යයන (පැවරුම්/තාවකාලික), 63% ක් අනධ්‍යයන (පැවරුම්) කාර්යමණ්ඩලය හා 16% ක් දෛනික පදනම මත සේවයේ පිහිටුවන ලද නිලධාරීන්ගෙන් සමන්විත වේ. (වගු අංක 02 සහ රූප සටහන අංක 01).

**වගු අංක 02 : 2017 වර්ෂයේ ආයතනයේ කාර්යමණ්ඩලය**

| **කාර්ය මණ්ඩල වර්ගීකරණය** | **සේවක සංඛ්‍යාව** |
|---|---|
| පරිපාලන | 3 |
| අධ්‍යයන (ස්ථිර) | 2 |
| අධ්‍යයන (පැවරුම්/තාවකාලික) | 9 |
| අනධ්‍යයන (පැවරුම්) | 40 |
| දෛනික පදනම මත සේවකයින් | 10 |
| **මුළු කාර්ය මණ්ඩලය** | **64** |




**රූප සටහන 03 : 2017 වර්ෂයේ ආයතනයේ කාර්යමණ්ඩලය**

වගු අංක 03 : 2017.12.31 දිනට ආයතනයේ පරිපාලන කාර්ය මණ්ඩලය

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | මහාචාර්ය කේ.ආර්.ආර්. මහානාම | වැඩබලන අධ්‍යක්ෂ (2017.07.02 දක්වා) |
| 2 | මහාචාර්ය එස්. සුභසිංහ | අධ්‍යක්ෂ (2017.07.03 සිට ) |
| 3 | එස්.ඒ.එස් . ප්‍රියදර්ශනී මිය | සහකර ලේඛකාධිකාරී |
| 4 | ඒ.ඒ.එස්.සී. උබේසිංහ මෙනවිය | සහකාර මූල්‍යාධිකාරී (2017/08/15 දක්වා) |
| 5 | ආර්.එම්.එම්.එච්.ඩී. රාජපක්ෂ | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී (වැඩබලන) (2017/08/16 සිට 2017/10/09 දක්වා) |
| 6 | යූ.එල්. අබේසූරිය මහතා | සහකාර මූල්‍යාධිකාරී (වැඩබලන) (2017/10/10) |

වගු අංක 04 : 2017.12.31 දිනට ආයතනයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය (පරිපාලන සහායක)

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | ඩබ්.කේ.කේ රාජිකා නිලංගනී මහත්මිය | කළමනාකාර සහකාර |
| 2 | ආර්.වී.පී.එන්.පී. කුමාර මහතා | කළමනාකාර සහකාර |
| 3 | ඒ.ජී.යූ වසන්ති මෙනවිය | කළමනාකාර සහකාර |
| 4 | යූ.එම්.ඒ.ඒ.එම්. ද සිල්වා මහත්මිය | කළමනාකාර සහකාර |
| 5 | ජේ.ඒ.යූ ශ්‍රීනාත් මහතා | ගබඩා භාර කරු |
| 6 | එම්.ජී.ජේ.පී.එස්. සඳරුවන් මහතා | කළමනාකාර සහකාර |
| 7 | ඩබ්.අයි. චතුමලී මහත්මිය | කළමනාකාර සහකාර |
| 8 | කේ.ඩී.සී. ආර්යසේන මහත්මිය | පරිගණක යෙදවුම් සහකාර (2017.12.04 සිට) |

වගු අංක 05 : 2017.12.31 දිනට ආයතනයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය (සාමාන්‍ය පරිපාලන)

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | කේ.එස්.ආර්. සම්පත් මහතා | ආරක්ෂක නිලධාරී |
| 2 | ඩබ්.එම්.චමින්ද මහතා | ආරක්ෂක නිලධාරී |
| 3 | කේ.පී. ගුණදාස මහතා | ආරක්ෂක නිලධාරී (අර්ධ කාලීන/ රාත්‍රී වැඩ මුරය) |
| 4 | එම්.ඒ.සී. ජයලත් මහතා | ආරක්ෂක නිලධාරී (අර්ධ කාලීන/ රාත්‍රී වැඩ මුරය) |
| 5 | එස්.වී. උපාලි මහතා | රියදුරු |

**<u>2017 වර්ෂයේ දී ඉඩම් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය</u>**

2013.10.11 දින පැවති හම්බන්තොට දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවේදී ආයතනය වෙත ඉඩම් අක්කර 50ක නීත්‍යානුකූල අයිතිය පැවරීමට එකඟ වී ඇති අතර ඉන් අක්කර 10ක ප්‍රමාණයක් මේ වන විටත් ආයතනය විසින් පරිහරණය කරයි. කෙසේ වෙතත්, අක්කර 40ක භූමි ප්‍රමාණයක් විල්මැන්න අභය භූමියට අයත් වන අතර එය වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතට ගැනේ.

අක්කර 40 ඉඩම් කොටස සඳහා වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසාන අනුමැතිය ලබා ගැනීම සඳහා වන අවශ්‍යතාවයන් ඉටු කිරීමට 2017 වර්ෂය තුල දී මොරටුව විශ්ව විද්‍යාලයේ නගර සහ ග්‍රාම නිර්මාණ

සැලසුම් දෙපාර්තමේන්තුව මගින් අක්කර 40 ඉඩම සඳහා ප්‍රධාන සැලසුම (Master Plan), භූ දර්ශන සැලසුම (Landscape plan), ජල අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම (Waste Water Management Plan), ජලාපවාහන සැලසුම් (Drainage Plan) සහ ගොඩනැගිලි සැලසුම් සකස් කිරීමේ කටයුතු සාර්ථකව කරගෙන යන ලදී. එසේම ආයතනයේ සංවර්ධන කටයුතු සඳහා අක්කර 40 ඉඩම් කොටස නිදහස් කර ගැනීම සඳහා එම ඉඩම් කොටස වටා පවතින විදුලි වැට නැවත ස්ථාපනය කිරීම සාර්ථකව සම්පූර්ණ කරන ලදී.

ආයතනයේ අක්කර 50 ඉඩම් කොටස සඳහා නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීම සඳහා, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ දී අදාළ ලේඛන සඳහා අත්සන් කරන ලදී.

## 2.1 අධ්‍යයන වැඩසටහනේ කාර්යසාධනය

2008 වසරේ දී කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය මගින් අධ්‍යයන පාඨමාලා හඳුන්වා දුන් අතර එමගින් දැනට කෘෂි කර්මාන්තයේ නියැලී සිටින පුද්ගලයන් හට කෘෂි තාක්ෂනය හා ග්‍රාමීය විද්‍යාවන් යනාදී ක්ෂේත්‍රයන් ඔස්සේ උසස් අධ්‍යාපනය ලබාදීමටත් ඔවුන් අතර මෙම අධ්‍යයන පාඨමාලා ප්‍රචලිත කිරීමට හා සංවර්ධනය කිරීමටත් අවස්ථාව ලැබී ඇත. කිසිවිටෙකත් උසස් අධ්‍යාපන මංපෙත් විවර නොවූ ගොවි ප්‍රජාව වෙත අධ්‍යාපනය, "මිශ්‍ර ක්‍රමවේදයක්" හරහා ලබාදීම මගින් පුද්ගල සහ සමාජයීය වශයෙන් ඔවුන්ගේ වෙනසක් සිදු කිරීමට හැකි වන්නේය. උසස් අධ්‍යාපනය ලබා ගැනීමට /හැදෑරීමට අවස්ථා සහ විභවයන් ඔවුන් සතු වුව ද ඔවුන්ගේ පෞද්ගලික හෝ පවුල් පසුබිම මත හෝ ආර්ථිකමය වශයෙන් පැන නැගුණ ගැටළු හේතුවෙන් එම අවස්ථා අහිමි වූ පිරිසක් මෙම අධ්‍යයන කටයුතුවල නිරත වේ. අධ්‍යයන පාඨමාලාවට ඇතුළත් වීම සඳහා වන ඇතුළත්වීමේ සුදුසුකම්වල සහ පාඨමාලා තෝරාගැනීමේදී දක්වන නම්‍යශීලීභාවය හදාරන්නන් හට ඉමහත් පහසුවක් වන අතර ආයතනය මගින් කරනු ලබන මගපෙන්වීම; නවීන තොරතුරු තාක්ෂණය හරහා ග්‍රාමීය ගොවි ප්‍රජාව හට ලබාදෙන මෙම උසස් අධ්‍යාපනයේ ඉහළ ගුණාත්මයට මෙන්ම අධ්‍යයන පාඨමාලා ඉතා පහසුවෙන් හැදෑරීමට හැකිවන පරිදි ඒවායෙහි ක්‍රමානුකූල බව පවත්වාගනිමින් ඊට අවකාශය සැළසීම ද ඔවුන්ගේ අධ්‍යයන, වෘත්තීමය සහ සමාජයීය අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීමට ඉමහත් රුකුලකි.

කෘෂිකාර්මික ව්‍යවසායකයින් සඳහා මෙය නවමු අධ්‍යාපනික අවස්ථාවක් වන අතර, ශ්‍රී ලංකාව තුළ දේශීය භාෂා මාධ්‍යයෙන් ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ දැනුම ඉහළ නැංවීම සඳහා ඔවුන්ට උදා වූ පළමු අවස්ථාව ද වේ. ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාව වැඩි වශයෙන් ග්‍රාමීය ප්‍රදේශයන් තුළ ඒකරාශී වී සිටින අතර, කෘෂිකර්මය සඳහා ඔවුන් ලබා දෙන දායකත්වය ඉතා ඉහළය. එහෙත් ග්‍රාමීය ගොවි ප්‍රජාවට සිය අධ්‍යාපනික, පුද්ගල සහ වෘත්තීමය සංවර්ධනය සඳහා ලැබෙන පහසුකම් ඉතා අඩුය. මේ නිසා, පළමු වරට, කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ වැලිගත්ත කෘෂි තාක්ෂණික සහ ග්‍රාමීය විද්‍යා ආයතනය විසින් (UCIARS) දැනට කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ රැඳී සිටින ගොවීන් සඳහා සහතිකපත්/ ඩිප්ලෝමා වැඩසටහනක් පිරිනමා තිබේ. මෙම වැඩසටහනේ සුවිශේෂී ලක්ෂණය වන්නේ ශ්‍රී ලංකාවට නැවුම් අත්දැකීමක් වන මාර්ග ගත හා විද්‍යුත් දුරස්ථ ඉගෙනුම් ක්‍රමය ඔස්සේ (online and distance e-learning method) මෙම අධ්‍යයන වැඩසටහන ක්‍රියාත්මක කිරීමයි.

**අධ්‍යයන පාඨමාලාවේ අරමුණු**

1. මිශ්‍ර ඉගැන්වීම් ක්‍රම වේදයක් ඔස්සේ (විශේෂිත වූ) ගොවි ප්‍රජාවට යාවජීව අධ්‍යාපනය, නම්‍යශීලීබව සහ ශිෂ්‍ය කේන්ද්‍ර ඉගෙනුම් ක්‍රමවේදය යනාදී මූලධර්ම මත පිහිටමින් ගොවි ප්‍රජාවට පුළුල් ප්‍රවේශයක් ලබාදෙමින් උසස් අධ්‍යාපනය (ප්‍රජාතාන්ත්‍රීකරණය කිරීම) සෑම පුරවැසියකුටම ලබාදීමේ අයිතිවාසිකම සනාථ කිරීම.

2. ගොවි ප්‍රජාව/කෘෂි කර්මාන්තයේ නියැලෙන්නන් දැනුම මත පදනම් වූ කෘෂි කර්මාන්තයේ යෙදවීම තුළින් කෘෂි නිෂ්පාදනවල ගුණාත්මය සහ ප්‍රමාණාත්මය වැඩි කිරීම.

**වැඩසටහනේ සුවිශේෂී ලක්ෂණ**

- කිසිදිනෙක උසස් අධ්‍යාපන සිහිනය සැබෑ නොවූ ගොවි ජනතාව වෙත අන්තර්ජාලය ඔස්සේ අධ්‍යාපනය ලබාදීම මගින් පුද්ගල සහ සමාජයීය වශයෙන් ඔවුන්ගේ වෙනසක් සිදුවීම.
- කෘෂි කර්මාන්තයේ නියැලෙන අතරතුර උසස් අධ්‍යාපනය හැදෑරීමේ අවස්ථාව/වරම ගොවි ප්‍රජාවට හිමි වීම.
- නව කෘෂි තාක්ෂණයන් සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය ශ්‍රී ලාංකීය ගොවි ප්‍රජාව වෙත හඳුන්වාදීම.
- ශ්‍රී ලාංකීක ගොවි ප්‍රජාව වෙනුවෙන් සැකසුණ ප්‍රථම විශ්ව විද්‍යාලයීය අධ්‍යයන පඨමාලාව වීම.
- වර්තමානය වන විට, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව ආයතනය මගින් ඩිප්ලෝමා , උසස් ඩිප්ලෝමා සහ උපාධි යන පාඨමාලා තුනක් හඳුන්වා දී තිබීම.

**කෘෂි තාක්ෂණික උපාධි පාඨමාලාවේ (BAgtec) අනුමැතිය ලබාදීම පිළිබඳ විස්තර**

සනාථන සභාවේ අනුමැතිය : 338 වැනි සනාථන සභා රැස්වීම (2010.09.29)-විෂය නිර්දේශය
පාලක සභාවේ අනුමැතිය : 462 වැනි පාලක සභා රැස්වීම (2012.08.15) - අතුරු ව්‍යවස්ථා
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය : 867 වැනි විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රැස්වීම (2013.02.07) - උපාධි පාඨමාලාව

කෘෂි තාක්ෂණික උපාධි පාඨමාලාවේ කාලසීමාව වසර 04 කි.

**කෘෂි තාක්ෂණික උපාධි පාඨමාලාවේ විෂය මාලාව (Curriculum)**

උපාධි පාඨමාලාවේ විෂය මාලාව (Curriculum) ශ්‍රී ලංකාවේ සුදුසුකම් රාමුවට (SLQF guidelines) අනුව සංශෝධනය කර ඇති අතර සංශෝධිත විෂය මාලාව, 2017 වර්ෂයේ ශිෂ්‍ය කණ්ඩායමේ සිට ක්‍රියාත්මක වේ.

**T:Theory (න්‍යාය), P: Practical (ප්‍රායෝගික), IL:Individual Learning through LMS (LMS ඔස්සේ තනි පුද්ගල ඉගෙනුම)**

| විෂය කේතය | විෂයේ නම | සම්මාන අගය (GPA) | සම්මාන නොවන අගය (NGPA) | අධ්‍යයන කාලය (පැය) T:P:IL |
|---|---|---|---|---|
| **Level 3** පළමු වසර පළමු සමාසිකය | | | | |
| AT1101 | ශෂ්‍ය විද්‍යා හා උද්‍යාන විද්‍යා මූලධර්ම. | 3 | - | 15:60:90 |
| AT1102 | ශාක ජීව විද්‍යා මූලධර්ම. | 2 | - | 15:30:60 |
| AT1103 | ජල සම්පාදනය හා ජල සම්පත් ඉංජිනේරු විද්‍යාව. | 3 | - | 15:60:60 |
| AT1104 | ගොවිපල සතුන්ගේ ව්‍යුහ විද්‍යාව හා කායික විද්‍යාව | 2 | - | 15:30:60 |
| AT1105 | කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපෘතියේ මූලධර්ම. | 2 | - | 15:30:60 |
| AT1106 | පාංශු විද්‍යා මූලධර්ම. | 2 | - | 15:30:60 |
| AT1107 | කෘෂි කාලගුණ විද්‍යාව. | 1 | - | 00: 30:60 |
| AT1108 | ඉංග්‍රීසි | 0 | 2 | 15:30:90 |
| **Total Credits** | | **15** | **2** | **105:300:540** |
| **Level 3** පළමු වසර දෙවන සමාසිකය | | | | |

| | | | | |
|---|---|---|---|---|
| AT1201 | එළවලු හා ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය හා කලමණාකරණය. | 2 | - | 15:30:60 |
| AT1202 | පලිබෝධ හා රෝග කලමණාකරණය. | 2 | - | 15:30:90 |
| AT1203 | ගොවිපල සතුන් කළමණාකරණය. | 3 | - | 15:60:60 |
| AT1204 | ගොවිපල බල හා යාන්ත්‍රිකරණය. | 2 | - | 15:30:60 |
| AT1205 | වාණිජ මල් වගාව. | 2 | - | 15:30:60 |
| AT1206 | පාංශු හා ශාක පෝෂණ කළමණාකරණය | 2 | - | 15:30:90 |
| AT1207 | ආහාර හා පෝෂණ විද්‍යාව හැදින්වීම | 2 | - | 15:30:90 |
| AT1208 | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | 0 | 2 | 00:30:30 |
| **Total Credits** | | **15** | **2** | **105:270:540** |
| | **Total Credits at Level 3** | **30** | **4** | **210:570:1080** |
| **Level 4** දෙවන වසර පළමු සමාසිකය | | | | |
| AT2101 | වැවිලි බෝග නිශ්පාදනය හා කළමණාකරණය. | 3 | - | 15:60:90 |
| AT2102 | බෝග වැඩිදියුණු කිරීම හා ජෛව තාක්ෂණය. | 2 | - | 15:60:90 |
| AT2103 | පළතුරු බෝග නිෂ්පාදනය හා කළමණාකරණය. | 2 | - | 15:30:60 |
| AT2104 | පසු අස්වනු කළමණාකරණය හා ආහාර තාක්ෂණය. | 2 | - | 15:30:90 |
| AT2105 | තෘණ විද්‍යාව සහ තෘණ බිම් කළමණාකරණය. | 2 | - | 15:30:60 |
| AT2106 | කෘෂි ව්‍යාපාර කළමණාකරණය. | 2 | - | 15:30:60 |
| AT2107 | මූලික සංඛ්‍යානය. | 2 | - | 15:30:60 |
| AT2108 | පරිගණක ආශ්‍රිත භාෂා අධ්‍යනය. | 0 | 2 | 15:30:90 |
| **Total Credits** | | **15** | **2** | **120:270:600** |
| **Level 4** දෙවන වසර දෙවන සමාසිකය | | | | |
| AT2201 | අපනයන කෘෂිකර්ම බෝග නිශ්පාදනය හා කළමණාකරණය. | 2 | - | 15:30:90 |
| AT2202 | ආරක්ෂිත බෝග වගාව. | 2 | - | 15:30:60 |
| AT2203 | සත්ත්ව අභිජනනය හා පට්ටි පාලනය. | 3 | - | 15:60:60 |
| AT2204 | ගොවිපල සැලසුම්කරණය. | 2 | - | 15:45:90 |
| AT2205 | කෘෂි ව්‍යාප්ති විද්‍යාව හා සන්නිවේදන තාක්ෂණය. | 2 | - | 15:30:90 |
| AT2206 | ජල ජීවී විද්‍යා නිශ්පාදන තාක්ෂණය. | 2 | - | 15:30:60 |
| AT2207 | ශාක පටක රෝපණ තාක්ෂණය. | 2 | - | 15:30:60 |
| AT2208 | ජීවන කුසලතා සංවර්ධනය. | 0 | 1 | 00:30:30 |
| **Total Credits** | | **15** | **1** | **105:285:540** |
| | **Total Credits at Level 4** | **30** | **3** | **225:555:1140** |
| **Level 5** තෙවන වසර පළමු සමාසිකය | | | | |
| AT3101 | උද්‍යාන අලංකරණය. | 3 | - | 30:60:90 |
| AT3102 | කෘෂි පාරිසරික විද්‍යාව. | 2 | - | 15:30:60 |

| | | | | |
|---|---|---|---|---|
| AT3103 | සත්ත්ව නිෂ්පාදන සැකසුම් තාක්ෂණය. | 2 | - | 15:30:60 |
| AT3104 | ආහාර සැකසුම හා අගය එකතු කිරීම. | 2 | - | 15:30:90 |
| AT3105 | ශාක වැඩිදියුණු කිරීමේ හා ජෛව තාක්ෂණයේ යෙදවුම්. | 2 | - | 15:30:90 |
| AT3106 | ඖෂධ පැළෑටි නිෂ්පාදනය හා කළමණාකරණය. | 2 | - | 15:30:60 |
| AT3107 | කෘෂි වන වගාව. | 2 | - | 15:30:60 |
| AT3108 | මානව හා සමාජ විද්‍යා මූලධර්ම. | 0 | 2 | 15:30:60 |
| **Total Credits** | | **15** | **2** | **135:270:570** |
| **Level 5** තෙවන වසර දෙවන සමාසිකය | | | | |
| AT3201 | ශාක නිෂ්පාදන පුහුණුව. | 4 | - | 00:120:90 |
| AT3202 | සත්ත්ව නිශ්පාදන පුහුණුව. | 3 | - | 00:90:90 |
| AT3203 | කෘෂි ඉංජිනේරු විද්‍යා පුහුණුව. | 2 | - | 00:60:90 |
| AT3204 | විද්‍යුත් වාණිජ කෘෂිකර්මාන්තය. | 2 | - | 30:30:60 |
| AT3205 | නිරපේක්ෂ කෘෂිකර්මාන්තය. | 2 | - | 30:30:60 |
| AT3206 | ව්‍යවසායකත්වය හා ව්‍යාපාර සැලසුම්කරණය. | 2 | - | 30:60:90 |
| AT3207 | සිද්ධි අධ්‍යනය. | 2 | - | 30:30:60 |
| AT3208 | ඉදිරිපත් කිරීමේ කුසලතා | 0 | 1 | |
| **Total Credits** | | **17** | **1** | **120:420:540** |
| **Total Credits at Level 5** | | **32** | **3** | **255:690:1110** |
| Level **6 සිව්වන වසර පළමු සමාසිකය** | | | | |
| AT4101 | පර්යේෂණ ක්‍රමවේදය සහ යෝජනා සංවර්ධනය | 2 | - | 15:30:90 |
| AT4102 | කෘෂිකාර්මික පරීක්ෂණ පැවැත්වීම සහ දත්ත විශ්ලේෂණය | 3 | - | 15:60:90 |
| AT4103 | කෘෂිකාර්මික ව්‍යාපෘති විශ්ලේෂණය හා කළමනාකරණය | 2 | - | 15:30:90 |
| AT4104 | කෘෂිකාර්මික අපද්‍රව්‍ය කළමනාකරණය | 2 | - | 15:30:90 |
| AT4105 | බලශක්ති පද්ධති නැවත ආරම්භ කිරීම | 2 | - | 15:30:60 |
| AT4106 | භෝග ආකෘති | 2 | - | 15:30:60 |
| AT4107 | විද්‍යුත් කෘෂිකර්මයේ භාවිතයන් | 2 | - | 30:30:60 |
| AT4108 | ජීව සාරධර්ම | 1 | - | 15:00:60 |
| AT4109 | ඉංග්‍රීසි | 0 | - | 15:30:60 |
| **Total Credits** | | **16** | **2** | **150:270:660** |
| Level **6 සිව්වන වසර දෙවන සමාසිකය** | | | | |
| AT4101 | කෘෂි තාක්ෂණික පර්යේෂණ ව්‍යාපෘතිය | 12 | 0 | 0 |
| **Total Credits** | | **12** | **0** | **0** |
| **Total Credits at Level** 6 | | **28** | **2** | **150:270:660** |

**වෛකල්පිත විෂයන්**

**T:Theory (න්‍යාය), P: Practical (ප්‍රායෝගික), IL:Individual Learning through LMS (LMS ඔස්සේ තනි පුද්ගල ඉගෙනුම)**

| **විෂය කේතය** | **විෂයේ නම** | **සම්මාන අගය (GPA)** | **සම්මාන නොවන අගය (NGPA )** | **අධ්‍යයන කාලය (පැය) T:P:IL** |
|---|---|---|---|---|
| AT1109 | වෘත්තීය මාර්ගෝපදේශනය සහ සංවර්ධනය | 2 | - | 15:30:60 |
| AT1209 | කෘෂි සංචාරක ව්‍යාපාරය | 2 | - | 15:30:60 |
| AT2109 | කෘෂිකර්මයට අදාළ විද්‍යුත් සහ උපකරණ සැකසීම | 2 | - | 15:30:60 |
| AT2209 | ආපදා කළමනාකරණය | 2 | - | 15:30:60 |
| AT3109 | කාර්මික පුහුණුව | 2 | - | 00:60:60 |
| AT3209 | සත්ව සුභසාධනය සහ සාරධර්ම | 2 | - | 15:30:60 |
| AT4209 | වනජීවී කළමනාකරණය | 2 | - | 15:30:60 |

ග්‍රාමීය ගොවි ප්‍රජාව කෘෂිකාර්මික ව්‍යවසායකයින් ලෙස සංවර්ධනය කිරීමේ දී මෙම වැඩසටහනට ඇතුළත් කොට ඇති ප්‍රායෝගික ක්‍රියාකාරකම්, පැවරුම්, සිද්ධාන්තමය කරුණු හා ආධුනිකව අධ්‍යයනය ලබන්නන් හට දෙනු ලබන සහය සේවාවන් වැනි සියලුම සංරචක ඔවුනගේ පෞද්ගලික සහ වෘත්තීය සංවර්ධනය කෙරෙහි ප්‍රශස්ත අන්දමින් ඉවහල් වී ඇත.

තවද, මෙම උපාධි පාඨමාලාව, තරුණ පරපුර තුළ ඉහල සමාජීය පිළිගැනීමක් ලබමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ රැඳී සිටීමට විශාල අභිප්‍රේරණයක් ඇති කර තිබේ.

**අධ්‍යයන වැඩසහටන්වලට ඇතුළත් වීම සඳහා සපුරා ලිය යුතු සුදුසුකම්**

ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත්වල ප්‍රකාශයට පත් කෙරෙන පුවත්පත් දැන්වීමක් තුළින් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් අයදුම්පත් කැඳවීම මගින් බඳවා ගැනීම සිදු කෙරේ.

- අවම වශයෙන් වසර 05ක කාලසීමාවක් තුළ කෘෂිකර්ම/ කෘෂි-ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ නියැලී සිටින සහ අ.පො. ස. (උසස් පෙළ) විභාගය සාර්ථකව සමත් වී ඇති පුද්ගලයින් බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

**හෝ**

- අවම වශයෙන් වසර 07ක කාලසීමාවක් තුළ කෘෂිකර්ම/ කෘෂි-ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ නියැලී සිටින සහ අ.පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සාර්ථකව සමත් වී ඇති ඕනෑම අයකු බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

සුදුසුකම්ලත් අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා අභියෝගාතා පරීක්ෂණයකට කැඳවනු ලැබේ. අභියෝගාතා පරීක්ෂණයේ ප්‍රතිඵලවලට අනුව, සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව අයදුම්කරුවන් ලියාපදිංචි කෙරේ.

**වගු අංක 06 : 2017 වර්ෂයේ දී කෘෂි තාක්ෂණවේදී උපාධියේ මට්ටම් 03 සඳහා බඳවා ගත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව (ඩිප්ලෝමා මට්ටම, උසස් ඩිප්ලෝමා මට්ටම, උපාධි මට්ටම)**

| කණ්ඩායම | ශිෂ්‍ය සංඛ්‍යාව | වෙනත්කරුණු |
|---|---|---|
| 2 වැනි කණ්ඩායම | 14 | උපාධි මට්ටම |
| 3 වැනි කණ්ඩායම | 13 | උපාධි මට්ටම |
| 4 වැනි කණ්ඩායම | 23 | උපාධි මට්ටම |
| 5 වැනි කණ්ඩායම | 25 | උසස් ඩිප්ලෝමා මට්ටම |
| 6 වැනි කණ්ඩායම | 55 | උසස් ඩිප්ලෝමා මට්ටම |
| 7 වැනි කණ්ඩායම | 56 | ඩිප්ලෝමා මට්ටම |
| 8 වැනි කණ්ඩායම | 80 | ඩිප්ලෝමා මට්ටම |
| 9 වැනි කණ්ඩායම | 168 | යෝග්‍යතා පරීක්ෂණයෙන් සහ සම්මුඛ පරීක්ෂණයෙන් ශිෂ්‍යයින් තෝරාගෙන ඇත. |

2017.12.31 දිනට අධ්‍යයන වැඩසටහන්වල නියුතු කාර්ය මණ්ඩලය පහත දැක්වේ.

**වගු අංක 07 : අධ්‍යයන කාර්ය මණ්ඩලය (ස්ථිර)**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | ආචාර්ය සුජාතා වීරසිංහ මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය |
| 2 | එන්.පී. විදානපතිරණ මිය | ජ්‍යෙෂඨ කථිකාචාර්ය II ශ්‍රේණිය , අංශ ප්‍රධාන |

**වගු අංක 08 : අධ්‍යයන කාර්ය මණ්ඩලය (පැවරුම් පදනම මත)**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | එස්.ඒ.පී. නෙල්කා මිය | පාඨමාලා සම්බන්ධීකාරක |
| 2 | එස්.එල්. නවරත්න මිය | පාඨමාලා සම්බන්ධීකාරක |
| 3 | එච්.කේ.ආර්.එස්. කුමාර මහතා | සහකාර පාඨමාලා සම්බන්ධීකාරක |
| 4 | ටි.ජී.බී.ධනුෂ්ක මහතා | සහකාර පාඨමාලා සම්බන්ධීකාරක |
| 5 | බී.පී. සිරිවර්ධන මහතා | සහකාර පාඨමාලා සම්බන්ධීකාරක |
| 6 | එච්.රෝහණධීර මහතා | පර්යේෂණ සහකාර |

**වගු අංක 09 : අනධ්‍යයන කාර්ය මණ්ඩලය**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | පී.බී. දර්ශන මහතා | පරිගණක යෙදවුම් සහකාර |
| 2 | එස්.ඒ.ආර්.ලක්මාල් මහතා | පරිගණක ක්‍රියාකරු සහ තොරතුරු තාක්ෂණ විද්‍යාගාර තාක්ෂණික ශිල්පී |

- එක් එක් විෂය ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ දැනුම ලබා දීම සඳහා මෙන්ම සියළුම පාඨමාලාවන්හි ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීමේ අරමුණින් කොළඹ විශ්ව විද්‍යාලයීය ශාස්ත්‍රීය මණ්ඩලය විසින් UCIARS කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය සහිතව අධ්‍යයන වැඩසටහන්වල එක් එක් පාඨමාලාව සඳහා විෂය ප්‍රවීණයින් පත් කර ඇත.

**2.2 ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන (RED) වැඩසටහනේ කාර්යසාධනය**

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ (UCIARS) ගොවි සිසුන්ගේ ආර්ථිකය සහ ජීවනෝපාය තවදුරටත් ශක්තිමත් කිරීමේ අදහසින් නව කෘෂි ව්‍යාපාර ආරම්භ කිරීම හෝ දැනට පවත්නා

කෘෂි ව්‍යාපාර නගා සිටුවීම සඳහා ඔවුනට මූලික මූල්‍යාධාර ලබාමේ අරමුණින් 2011 වර්ෂයේ දී නවමු වැඩසටහනක් ලෙස "ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන (RED)" වැඩසටහන ආරම්භ කරන ලදී. ශස්‍ය විද්‍යාව පිළිබඳ සම්මානිත විශ්‍රාමලත් මහාචාර්යවරයෙකු මෙන්ම කොරියාවේ ව්‍යාපාර කෘෂිකර්ම සංකල්පයේ නිර්මාතෘවරයා වන කිම් ජේ හෝ මැතිතුමාගේ තාක්ෂණික උපදේශකත්වයෙන් ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන (RED)වැඩසටහන සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. මහාචාර්ය කිම් කොයිකා යනු (කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය) විසින් UCIARS වෙත එවා ඇති ලොව මිතුරු උපදේශකවරයා වේ.

RED වැඩසටහනේ ආරම්භක පියවරක් ලෙස, නව කෘෂි ව්‍යාපාර ආරම්භ කිරීම හෝ දැනට පවත්නා කෘෂි ව්‍යාපාර නගා සිටුවීම සඳහා තෝරාගත් දක්ෂ ගොවි සිසුන් වෙත ආයතනය මගින් මූල්‍යාධාර පිරිනමන ලදී. 2012 ජනවාරි මාසයේ දී ආයතනය සහ එක් එක් ශිෂ්‍යයා අතර අත්සන් කරනු ලැබූ ගිවිසුමක් යටතේ තෝරාගත් ප්‍රතිලාභීන් වෙත නම්‍යශීලී කොන්දේසි සහිතවරු. 100,000.00 දක්වා මූල්‍යාධාර පිරිනමන ලදී. අපේක්ෂිත ප්‍රතිඵල අනුව RED වැඩසටහනේ ප්‍රගතිය 2013 දෙසැම්බර් මස අවසන් වන විට සැලකියයුතු මට්ටමක පැවතිණ. 2013 දෙසැම්බර් මස අවසන් වන විට අතිරේක වටිනාකම් නිර්මාණය තුළ කාර්ය සාධනය ආසන්න වශයෙන් මිලියන 3ක් වූ අතර, මෙම කාලසීමාව තුළ ව්‍යවසායකයින් 12 දෙනෙකු විසින් නව රැකියා අවස්ථා 12 ක් උත්පාදනය කොට ඇත.

2014 වර්ෂයේ දී 1% ක පොළී පදනම මත රුපියල් මිලියන දෙකක මුදලක් ආයතනය වෙත ලබා දීමට ගොවි භාරකාර අරමුදල එකඟතාව පළ කළ අතර එම මුදල් සිසුන් අතර බෙදා දෙන ලදී. මෙම ගිවිසුම අනුව, ඔවුන් විසින් ආයතනය වෙත රු.1,000,000.00 ක මුදලක් ලබා දුණි. තමාගේම කෘෂි ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ තම ව්‍යාපාර වැඩි දියුණු කිරීම සඳහා මූල්‍යාධාර පිරිනැමීම පිණිස වසායකයින් හත් දෙනෙකු තෝරාගනු ලැබූ අතර 2014 මාර්තු 07 වැනි දින ඔවුන් අතර එම අරමුදල් බෙදා දෙන ලදී.

මෙම වැඩසටහනේ දෙවන අදියර ලෙස, ගොවි භාරකාර අරමුදල මගින් තවත් රු.1,000,000.00ක් නිදහස් කරනු ලැබූ අතර, තමන්ගේම කෘෂි ව්‍යාපාර වර්ධනය කර ගැනීම සඳහා තෝරාගත් කෘෂි ව්‍යවසායකයින් 10 දෙනෙකු අතර මෙම මුදල 2014 නොවැම්බර් මස බෙදා දෙන ලදී. තවද, ආයතනය විසින් 2014 දෙසැම්බර් මස HETC ව්‍යාපෘතිය යටතේ ගොවි සිසුන් තිදෙනෙක් අතර රෝපණ ද්‍රව්‍ය බෙදා දෙන ලදී. මේ යටතේ, ආයතනය ගොවි සිසුන් වෙත රු.256,600.00 ක් වටිනා "ජර්බරා" පැළ සහ "TJC" අඹ පැළ ලබාදෙන ලදී. ගොවි භාරකාර අරමුදල මගින් 2015 වර්ෂය සඳහා රු. 1,400,000.00ක් පිරිනමන ලදී. මෙම වැඩසටහනට සම්බන්ධවීම සඳහා ගොවි සිසුන් දහසය දෙනෙකු අයදුම් කර ඇතත් තමන්ගේම කෘෂි ව්‍යාපාරය ආරම්භ කිරීමට හෝ තම ව්‍යාපාරය වැඩි දියුණු කිරීම සඳහා ගොවි සිසුන් 07 දෙනෙක් අතර පමණක් එම රු.1,400,000.00 අරමුදල බෙදා දීමට ආයතනයට හැකි විය. මෙම වැඩසටහන යටතේ, 2015 ජූලි මස ගොවි සිසුන් දෙදෙනෙකු වෙත රු.135,960.00ක් වටිනා කෙසෙල් පැළ සහ රු.375,250.00ක් වටිනා "රෝස" සහ "ජර්බරා" රෝපණ ද්‍රව්‍ය ගොවි සිසුන් 3 දෙනෙක් වෙත HETC ව්‍යාපෘති අරමුදල් යටතේ පොළී රහිත ණයක් ලෙස බෙදා දෙන ලදී.

2015 වර්ෂයේ වැඩසටහනේ දෙවන අදියර යටතේ රු. 2,000,000.00 ක මුදලක් ආවරණය කිරීම සඳහා (පළමු අදියර යටතේ 2015 වර්ෂයේ දී රු. 1,400,000.00 ලබා දී ඇත), 2016 වර්ෂයේ දී තවත් රු. 600,000.00 ක මුදලක් ගොවි භාරකාර අරමුදල මගින් ආයතනය වෙත නිදහස් කරන ලද අතර තමාගේම කෘෂි ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා තෝරාගත් කෘෂි ව්‍යවසායකයින් 03 දෙනකු වෙත මෙම අරමුදල් 2016 ජූලි මස බෙදා දෙන ලදී.

**2017 වර්ෂයේ කාර්යසාධනය**

2017 වර්ෂයේ දී ගොවීන් සඳහා මූල්‍ය සහයෝගය (ණය ලබා දීම) සැපයීම කළමනාකරණ මණ්ඩලය විසින් නවතා දමන ලද අතර එයට හේතුව කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලිය ප්‍රකාරව ආයතනයට ණය නිකුත් කිරීම සඳහා බලතල නොමැති වීම හා ණය අය කර ගැනීමේ ප්‍රතිශතය ඉතාමත් පහල මට්ටමක පැවතීමයි.

ණය (ගොවි භාරකාර අරමුදලින් (FTF) ලබා දුන් ණය සහ රෝපණ ද්‍රව්‍ය ණය යන දෙකම) අයකර ගැනීම ආරම්භ කිරීමට පෙරාතුව මාස 06 ක සහන කාලයක් ගොවීන්ට ලබා දී තිබේ. 2017 වර්ෂය තුළ එක් එක් ණය අයකර ගැනීමේ ප්‍රතිශතය පහත දක්වා තිබේ.

**වගු අංක 10 : ණය අයකර ගැනීමේ ප්‍රතිශතමය ප්‍රගතිය**

| ණය | ණය ලබා දී ඇති ගොවීන් සංඛ්‍යාව | පොලිය සමඟ ණය මුදල (රුපියල්) | 201712.31 දින වන විට අය කර ගත යුතු ණය ප්‍රතිශතය | 2017.12.31 වන විට සත්‍ය අයකර ගැනීම් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| පළමු ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන (RED) ණය | 12 | 1,148,000.00 | 100% | 92% |
| FTF ණය – පළමු අදියර | 07 | 1,120,000.00 | 100% | 97% |
| FTF ණය –දෙවන අදියර | 10 | 1,120,000.00 | 100% | 62% |
| FTF ණය –තෙවන අදියර | 07 | 1,568,000.00 | 82% | 51% |
| රෝපණ ද්‍රව්‍ය ණය-2014 | 03 | 256,000.00 | 100% | 52% |
| රෝපණ ද්‍රව්‍ය ණය-2015 | 05 | 511,210.00 | 91% | 41% |
| FTF ණය – සිව්වන අදියර | 03 | 672,000.00 | 50% | 49% |

**2.3 පැළ තවාන්/ විද්‍යාගාර කාර්යසාධනය**

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලිය අනුව 2008 වර්ෂයේ දී කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය ආරම්භ කළ ද, කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘතියක් ලෙස 1998 දී දුප්පත් ග්‍රාමීය ගොවි ජනතාව ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ සමාජ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම උදෙසා පටක රෝපණ ඒකකය ආරම්භ කරන ලදී. 2001 වර්ෂයේ දී, විද්‍යා පීඨයේ පැළෑටි විද්‍යා අංශය (Department of Plant Science) මගින් ආදර්ශනයක් ලෙස මෙම ආයතනය සඳහා පටක රෝපණ කෙසෙල් හා කිරි අල පටක රෝපණය කිරීම හඳුන්වා දෙන ලදී. 2003 වර්ෂයේ සිට මෙම ආයතනය කොළඹ විශ්ව විද්‍යාලයේ මඟ පෙන්වීම හා අධීක්ෂණය යටතේ ආයතනයේම නිෂ්පාදනයක් ලෙස පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදනය කර ගෙනයාමට සමත් විය. අලුතින් පත්කරන ලද විද්‍යාගාර කාර්ය මණ්ඩල පුහුණු කිරීම සඳහා, රැකියාවේ යෙදෙමින්ම පුහුණු කිරීමේ කටයුතු (on the job training) ආයතනය මගින් සිදුකරන ලදී.

**වගු අංක 11 : 2017.12.31 වන විට පැළතවාන් සහ විද්‍යාගාර කාර්ය මණ්ඩලය පහත දක්වා ඇත**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | එච්.රෝහණධීර මහතා | පර්යේෂණ සහකාර (අංශ ප්‍රධාන-විද්‍යාගාර/පැළ තවාන්) |
| 2 | ටී.ඒ.කේ.වයි. ඉඳුනිල් මහතා | ක්ෂේත්‍ර ප්‍රධානි |
| 3 | එච්.කේ.එස්. ඉෂාර මහතා | ක්ෂේත්‍ර සහකාර |
| 4 | පී.ඩබ්.ඒ. චමින්ද ජයලත් මහතා | තාක්ෂණික සහකාර |
| 5 | බී.ජී. සුසිර කුමාර මහතා | තාක්ෂණික සහකාර |
| 6 | ඒ.එන්. අබේගුණවර්ධන මිය | පටක රෝපණ සහකාර |
| 7 | එච්.කේ. සමන්ති නිලිනි කුමාරි මිය | පටක රෝපණ සහකාර |
| 8 | එම්.ජී.සී. සුදර්ශනී මිය | පටක රෝපණ සහකාර |
| 9 | ඒ. ප්‍රියංගා සුදර්ශි මිය | පටක රෝපණ සහකාර |
| 10 | යූ. අනුෂා රුවනි මෙනවිය | පටක රෝපණ සහකාර |
| 11 | ඩබ්.එච්. දිස්නා සඳමාලි මිය | පටක රෝපණ සහකාර |

| | | |
|---|---|---|
| 12 | අයි.ජී. දිලිනි නිරෝෂා කුමාරි මෙනවිය | පටක රෝපණ සහකාර |
| 13 | ඕ.පී. නිලූකා සුභාෂිනී මෙනවිය | පටක රෝපණ සහකාර |
| 14 | ඩී. ඉෂාදි නිමල්ගා මෙනවිය | පටක රෝපණ සහකාර |
| 15 | කේ.පී. උදේනි නිසංසලා මෙනවිය | පටක රෝපණ සහකාර |
| 16 | ආර්.ඒ. මධුසරනී දිල්හාරා මෙනවිය | පටක රෝපණ සහකාර |
| 17 | ඩබ්.ජී. දුලංජලී මෙනවිය | පටක රෝපණ සහකාර |
| 18 | ඩබ්.එච්. විචිත්‍රා කල්පනී මෙනවිය | පටක රෝපණ සහකාර |
| 19 | ඉසංකා චමේදනී දොඩම්පේ මෙනවිය | පටක රෝපණ සහකාර |
| 20 | එන්.එස් .පෙරේරා මෙනවිය | පටක රෝපණ සහකාර |
| 21 | එච්.ආර්. අකීෂා මධුමාලී මෙනවිය | පටක රෝපණ සහකාර |
| 22 | ඩබ්.එස්. මධුෂානී මෙනවිය | පටක රෝපණ සහකාර |
| 23 | කේ.එල්.ඒ. අනුරාධා මෙනවිය | පටක රෝපණ සහකාර |
| 24 | ඩබ්.කේ.එම්. ශෂිකලා මෙනවිය | පටක රෝපණ සහකාර |
| 25 | පී.එම්. තුසිතා මෙනවිය | පටක රෝපණ සහකාර |
| 26 | ජී.ඒ. විමුක්ති ෂාලිකා මෙනවිය | පටක රෝපණ සහකාර |
| 27 | ඩබ්.එච්.යූ. කෞෂල්‍යා මෙනවිය | පටක රෝපණ සහකාර |
| 28 | එන්.එස්. ප්‍රදීප් මහතා | ක්ෂේත්‍ර සහකාර |

**2017 වර්ෂයේ කාර්යසාධනය**

**වගු අංක 12: විද්‍යාගාර තුනේ පැළ නිෂ්පාදන වාර්තා (සංඛ්‍යාව)**

| මාසය | විද්‍යාගාරය අංක 01 | විද්‍යාගාරය අංක 02 | විද්‍යාගාරය අංක 03 | එකතුව |
|---|---|---|---|---|
| ජනවාරි | 8,116 | 8,125 | 4,145 | 20,386 |
| පෙබරවාරි | 10,846 | 5,784 | 4,897 | 21,527 |
| මාර්තු | 11,198 | 9,909 | 4,043 | 25,150 |
| අප්‍රේල් | 8,276 | 7,647 | 3,780 | 19,703 |
| මැයි | 11,788 | 8,340 | 4,223 | 24,351 |
| ජූනි | 10,816 | 9,154 | 3,290 | 23,260 |
| ජූලි | 11,278 | 9,975 | 3,931 | 25,184 |
| අගෝස්තු | 8,327 | 8,970 | 4,854 | 22,151 |
| සැප්තැම්බර් | 10,582 | 10,878 | 3,960 | 25,420 |
| ඔක්තෝබර් | 9,109 | 8,023 | 4,600 | 21,732 |
| නොවැම්බර් | 11,437 | 7,982 | 5,062 | 24,481 |
| දෙසැම්බර් | 5,959 | 7,395 | 4,826 | 18,180 |
| **එකතුව** | **117,732** | **102,182** | **51,611** | **271,525** |




**රූපසටහන 02 : විද්‍යාගාර තුනේ පැළ නිෂ්පාදනය සංසන්දනය කිරීම**

විද්‍යාගාරය අංක 01 සහ 02 මගින් එක් මසක් තුළ පැළ 8000ක් නිෂ්පාදනය කිරීම සඳහා කටයුතු කළ අතර, විද්‍යාගාරය අංක 03 එක් මාසයක් තුළ පැළ 4000 ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කරයි. විද්‍යාගාරය අංක 01 තම ඉලක්කයෙන් 122.64% ක ප්‍රතිශතයක් සාක්ෂාත් කර ගෙන තිබෙන අතර, විද්‍යාගාරය අංක 02 තම ඉලක්කවලින් 106.44%ක ප්‍රතිශතයක් සාක්ෂාත් කර ගෙන තිබේ. විද්‍යාගාරය අංක 03 සිය ඉලක්කවලින් 107.52%ක් සාක්ෂාත් කර ගෙන ඇති අතර විද්‍යාගාරය ත්‍රිත්ත්වය පිළිබඳව සමස්තයක් වශයෙන් සලකා බැලීමේදී, 2017 වර්ෂය සඳහා වූ ඉලක්කවලින් 113.13%ක් සාක්ෂාත් කර ගෙන ඇත.

**වගු අංක 13 : පසුගිය වසර පහ තුළ පැළ නිෂ්පාදනය සැසඳීම (සංඛ්‍යාව)**

| මාසය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| ජනවාරි | 15,388 | 18,514 | 20,315 | 20,594 | 20,386 |
| පෙබරවාරි | 15,923 | 18,209 | 20,127 | 20,476 | 21,527 |
| මාර්තු | 15,709 | 18,960 | 20,611 | 16,918 | 25,150 |
| අප්‍රේල් | 12,015 | 14,275 | 12,580 | 10,815 | 19,703 |
| මැයි | 21,158 | 10,043 | 14,852 | 19,079 | 24,351 |
| ජූනි | 12,042 | 10,550 | 14,218 | 19,359 | 23,260 |
| ජූලි | 13,370 | 12,791 | 12,029 | 19,750 | 25,184 |
| අගෝස්තු | 17,665 | 7,770 | 14,021 | 20,875 | 22,151 |
| සැප්තැම්බර් | 15,769 | 18,831 | 18,030 | 24,180 | 25,420 |
| ඔක්තෝබර් | 20,617 | 25,300 | 22,427 | 23,481 | 21,732 |
| නොවැම්බර් | 21,961 | 23,106 | 21,557 | 18,807 | 24,481 |
| දෙසැම්බර් | 10,878 | 26,409 | 21,339 | 18,100 | 18,180 |
| **එකතුව** | **1,92,495** | **2,04,758** | **2,12,106** | **2,32,434** | **2,71,525** |




**රූප සටහන 03: 2013-2017 වර්ෂ තුල පැළ නිෂ්පාදනය සැසඳීම**

පසුගිය වසර පහ තුළ රැස් කරන ලද දත්ත වලට අනුව, ජනවාරි සිට අප්‍රේල් දක්වා සහ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා වූ මාස කිහිපය ඉහළ ඉල්ලුම් රටාවක් සහිත කාල පරිච්ඡේදයක් ලෙස පෙනී යයි. නමුත් 2017 වර්ෂය සැලකීමේදී එකී සාමාන්‍ය රටාවෙන් වෙනස් වී ඇත. එමනිසා, ඉල්ලුම අධික කාල සීමාවල දී තවාන් වෙතින් නිකුත් කරනු ලබන පැළ ප්‍රමාණය ඉහළ නැංවීම සඳහා නිෂ්පාදන සැලසුම් වෙනසකට ලක් කරන ලදී. විද්‍යාගාරයෙන් නිකුත් කරන පැළ ප්‍රමාණය, වර්ෂය පුරා සිදු කරන පැළ අලෙවිය අනුව වෙනස්වන අතර එය වර්ෂාව, නියඟය වැනි පාරිසරික සාධක හා කෙසෙල් සඳහා පවතින වෙළෙඳ පොල මිල සහ ප්‍රජා ආකල්ප ආදී වෙනත් සාධක මත රඳා පවතී.

## 2017 වර්ෂය තුළ කෙසෙල් පැළ නිෂ්පාදනය සැසඳීම

2017 වර්ෂය තුළ සමස්ථ නිෂ්පාදනයෙන් 96.01% ක ප්‍රතිශතයක් ඇඹුල් කෙසෙල් වූ අතර කෝලිකුට්ටු කෙසෙල් පැළ ප්‍රතිශතය 3.94% ක් පමණක් විය.

පසුගිය වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂය තුළ පැළ නිෂ්පාදනය 39,091 කින් වැඩි වී ඇති බවට පැහැදිලි සාක්ෂි ඇත. එමෙන්ම, පටක රෝපණ කෙසෙල් මිලදී ගැනීමේ දී ගොවීන්ට මුහුණ පෑමට සිදු වන ප්‍රමාදය වැළැක්වීම සඳහා නව ක්‍රමවේදයක් (වාර නිෂ්පාදනය වැඩිකිරීම) හඳුන්වාදෙන ලදී.

### පැළ අලෙවිය සැසඳීම

පටක රෝපණ කෙසෙල් පැළ සඳහා ඇති ඉල්ලුම දේශගුණික තත්ත්වය මත රඳා පවතින අතර වර්ෂා කාලවලදී (සැප්තැම්බර් සිට අප්‍රේල්) ඉහළම ඉල්ලුමක් සහ වියළි කාලවල දී (මැයි සිට අගෝස්තු) අඩු ඉල්ලුමක් වාර්තා වී ඇත. වර්ෂා රටාව වගාව කෙරෙහි සෘජුවම බලපාන අතර ගොවීන් වර්ෂා කාලවල දී පටක රෝපණ කෙසෙල් පැළ විශාල ප්‍රමාණයක් වගා කරයි.

මෙම කාලය තුළ විශේෂයෙන් දෙසැම්බර් සහ අප්‍රේල් උත්සව කාලය තුළ කෙසෙල් කැන් සඳහා අධික ඉල්ලුමක් පවතින බැවින් එම කාලය ඉලක්ක කර ගනිමින් ගොවීන් කෙසෙල් වගාවේ නිරත වේ. එමනිසා, මෙවැනි හිතකර දේශගුණික සාධක සහ වෙළෙඳ පොලේ ඉල්ලුම සලකා බලමින් ගොවීන් පටක රෝපණ කෙසෙල් පැළ මිලදී ගනී.

නමුත් 2017 වර්ෂය සැලකීමේදී, වර්ෂය පුරාම පටක රෝපණ කෙසෙල් පැළ සඳහා පවතින ඉල්ලුම සමාන ප්‍රතිශතයකින් පැවති අතර මෙම ස්ථාවර ඉල්ලුම සඳහා හේතු වූයේ වර්ෂය පුරාම කෙසෙල් සඳහා ඉහළ වෙළඳපොල මිලක් පැවතීමයි.

වගු අංක 14 : පසුගිය වසර පහ තුළ පැළ අලෙවිය සැසඳීම (සංඛ්‍යාව)

| මාසය | 2013 (සංඛ්‍යාව) | 2014 (සංඛ්‍යාව) | 2015 (සංඛ්‍යාව) | 2016 (සංඛ්‍යාව) | 2017 (සංඛ්‍යාව) |
|---|---|---|---|---|---|
| ජනවාරි | 14080 | 10,823 | 14,672 | 21,738 | 17,980 |
| පෙබරවාරි | 13119 | 6,816 | 18,427 | 17,950 | 22,141 |
| මාර්තු | 13241 | 2,715 | 19,835 | 14,924 | 22,536 |
| අප්‍රේල් | 15641 | 7,697 | 20,579 | 13,721 | 21,467 |
| මැයි | 9410 | 7,113 | 12,531 | 12,830 | 19,652 |
| ජූනි | 8419 | 3,381 | 15,132 | 13,527 | 20,780 |
| ජූලි | 14592 | 3,680 | 12,682 | 11,490 | 20,576 |
| අගෝස්තු | 11242 | 18,404 | 12,954 | 19,465 | 21,097 |
| සැප්තැම්බර් | 12992 | 11,766 | 20,943 | 18,837 | 20,877 |
| ඔක්තෝබර් | 14812 | 18,498 | 15,151 | 22,040 | 22,302 |
| නොවැම්බර් | 15676 | 25,705 | 16,656 | 17,327 | 21,137 |
| දෙසැම්බර් | 14491 | 13,369 | 24,595 | 20,884 | 20,530 |
| එකතුව | **157,715** | **129,967** | **204,157** | **204,733** | **2,51,075** |




රූප සටහන 04: 2013-2017 වර්ෂ තුල පැළ අලෙවිය සැසඳීම

**වගු අංක 15 : අලෙවි කරන ලද පැළ සංඛ්‍යාව අනුව පැළ අලෙවිය සැසඳීම– 2017**

| විස්තරය | පැළ සංඛ්‍යාව |
|---|---|
| පැළ අලෙවිය 100> | 13,904 |
| පැළ අලෙවිය 100< | 234,868 |




**රූප සටහන 05: 2017 වර්ෂයේ පැළ අලෙවිය**

**වගු අංක 16 : ප්‍රභේද අනුව පැළ අලෙවිය - 2017**

| ප්‍රභේදය | පැළ සංඛ්‍යාව |
|---|---|
| ඇඹුල් | 241,669 |
| කෝලිකුට්ටු | 9,287 |
| DC | 119 |




**රූප සටහන 06: ප්‍රභේද අනුව පැළ අලෙවිය**

2017 වර්ෂය තුළ පටක රෝපිත කෙසෙල් පැළ අලෙවියෙන් මිලියන 18.8 ක ආදායමක් උපයා ගැනීමට ආයතනයට හැකි විය. ක්ෂේත්‍රය තුළ රෝග වැළඳීමේ හැකියාව අඩු මට්ටමක පැවතීම හේතුවෙන් ඉහළ ඉල්ලුමක් සහිත ප්‍රභේදය ඇඹුල් කෙසෙල් වූ අතර වසර පහක කාලයක් දක්වා ඉහල ඉපයීම් ශක්‍යතාවක් පවත්වාගෙන තිබේ. දෙවන පරම්පරාවේදී ඇතිවන දරුණු පැනමා රෝගය හේතු කොට ගෙන තනි පැළ කළමනාකරණ ක්‍රමය යටතේ ගොවීන් කෝලිකුට්ටු කෙසෙල් වගා කරනු ලබයි. මිටි කැවෙන්ඩිෂ් නැමැති කෙසෙල් ප්‍රබේදය තෙත් කලාපය සඳහා පමණක් නිර්දේශ කල හැකි අතර, ඒ සඳහා අඩු ඉල්ලුමක් පවතින අතර ඉතාමත් සීමිත තෙත් කලාපීය ගොවීන් පිරිසක් සඳහා ආයතනය විසින් පහසුකම් සලසනු ලබයි.

පටක රෝපිත කෙසෙල් සඳහා පවතින ඉල්ලුම සම්ප්‍රදායිකව නිෂ්පාදිත පැළ සඳහා පවතින ඉල්ලුමට වඩා ඉහල මට්ටමක පවතින අතර, දිගුකාලීන ලාභදායිත්වය සහ රෝගවලට භාජනයවීම අඩු වීම හේතු කොට ගෙන ඇඹුල් කෙසෙල් සඳහා පවතින ඉල්ලුම වැඩිවිය. ආයතනය සමග සම්බන්ධව කටයුතු කරන ගොවීන්ගෙන් බහුතරයක් (62%) නියෝජනය කරනුයේ මිල දී ගැනීමේ හැකියාව අඩු මට්ටමක පවතින ගොවීන් වන අතර ඉහළ මිලදී ගැනීමේ හැකියාවක් ඇති ගොවීන් ආයතනය සමඟ සම්බන්ධ වී ඇත්තේ ඉතා අඩු ප්‍රමාණයකි (38%).

**වගු අංක 17: 2017 වර්ෂයේ ගොවීන්ගේ මිලදී ගැනීමේ හැකියාව**

| ගොවීන්ගේ මිලදී ගැනීමේ හැකියාව | ගොවීන් සංඛ්‍යාව |
|---|---|
| පැළ 100 කට වඩා අඩුවෙන් මිලදී ගත් ගොවීන් සංඛ්‍යාව | 464 |
| පැළ 100 කට වඩා වැඩියෙන් මිලදී ගත් ගොවීන් සංඛ්‍යාව | 288 |




**රූප සටහන 07: 2017 වර්ෂයේ ගොවීන්ගේ මිලදී ගැනීමේ හැකියාව**

ආයතනය මගින් අඩු මිල ගණන් යටතේ දේශීය ගොවීන්ට කෙසෙල් පැළ ලබාදෙන අතර ලංකාවේ දුරස්ථ ප්‍රදේශ නියෝජනය කරමින් ගොවීන් රැසක් ආයතනය සමග සම්බන්ධව කටයුතු කරයි. ආයතනයේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය විසින් එම වගාවන් විධිමත්ව නියාමනය කරමින් ඔවුන්ට අවශ්‍ය උපදෙස් සහ මගපෙන්වීම ලබා දේ. පටක රෝපණ කෙසෙල් පැළ වගා කරන ගොවි ප්‍රජාව රටපුරා ව්‍යාප්ත කිරීම සඳහා ආයතනයේ ක්ෂේත්‍ර නිලධාරීන් ක්‍රමානුකූලව ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කරන ලදී.

**පටක රෝපණ කෙසෙල් පැළ සම්බන්ධ නිෂ්පාදන ක්‍රියාවලිය**

පටක රෝපණ තාක්ෂණය යනු අපූති තත්වයන් යටතේ කෘතීම මාධ්‍ය උපයෝගී කර ගනිමින් වෛරස් වලින් තොර දුහිතෘ ශාක (මාතෘ පටක) නිෂ්පාදනය කිරීමයි. එම නිසා තාක්ෂණය විශේෂිත වන අතර එබැවින් මාතෘ පටක පිහිටුවීමේ සිට දැඩිකිරීම ආරම්භ කරන තෙක් වන සියළුම ක්‍රියා කාරකම් සඳහා දක්ෂ එමෙන්ම නිපුණතාවයෙන් හෙබි සේවක පිරිසක් අවශ්‍ය වේ. දර්ශීය ලෙස, පටක රෝපණ තාක්ෂණය ප්‍රධාන පියවරයන් පහක් ඔස්සේ සිදුකරණු ලබන අතර, එනම්, නිරෝගී හා දිරිමත් මාතෘ ශාක වරණය (තෝරා ගැනීම), කෘතීම පෝෂන මාධ්‍යක් තුළ මාතෘ ශාක කොටස් පිහිටු වීම, අංකුර ජනන අවධිය, මුල් වර්ධන අවධිය හා පැළ දැඩි කිරීමේ අවධියයි. අග්‍රස්ථ විභාජක රෝපණය මගින් කෙසෙල් පැළ නිෂ්පාදනය ආයතනය තුළ සිදුකරන අතර නිෂ්පාදනයේ ගුණාත්මය හා විකෘති තත්ව අඩු කිරීම සඳහා උපායමාර්ගික පියවරයන් ගනු ලබයි. ඉතා උසස් තත්වයේ සම්මත පරාමිතීන් ජීවානුහරන ක්‍රියාවලි සඳහා යොදාගනු ලබන අතර උපවගා මට්ටම් (sub culture stages) 8-10 අතර වූ උපරිම ප්‍රමාණයක් භාවිතා කරනු ලැබේ. ක්‍රමවත් හා පරිපූර්ණ ලෙස දත්ත වාර්ථා තැබීම තුළින් අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවකදී අදාල මාතෘ පටකය පිළිබඳව සියළුම විස්ථර පහසුවෙන් ලබාගත හැකිය. සේවක පිරිසගේ යෝග්‍යතාවය ධාරිතාවය මත නිවරදි ලෙස ඔවුන් සුදුසු නිෂ්පාදන අවස්ථාවේ පිහිටුවා ඇත.




**රූප සටහන 08: පටක රෝපණ කෙසෙල් පැළ සම්බන්ධ නිෂ්පාදන ක්‍රියාවලිය**

**2017 වර්ෂය තුළ අත්කර ගනු ලැබූ කාර්ය සාධනය (පටක රෝපණ නිෂ්පාදන ඒකකය)**

| 47 | කේ.එල්.ඒ.ඒ.තත්සරනි | 2016-05-16 | 1 | 21,910.00 | 10,955.00 | 10,955.00 |
| | **මුළු එකතුව** | | | **1,710,896.25** | **4,933,734.13** | **4,933,734.13** |

**කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය**
**කොළඹ විශ්ව විද්‍යාලය**
**2017.12.31 දිනට ලී බඩු උපකරණ ක්ෂයවීම් උපලේඛනය**

| ගෘහ උපකරණ ක්ෂයවීම් | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනීකරණය කළ දිනය | භාණ්ඩයේ නම | වටිනාකම | ක්ෂය කිරීම් කාලය (දිනය) | ක්ෂයවීම් අනුපාතය | ක්ෂයවීම් වටිනාකම |
| | ආරම්භක ශේෂය | 6,935,047.00 | | | |
| | 2017 වර්ෂයේ ක්ෂයවීම | | | | 693,504.69 |
| 8-අප්රේල්-17 | ලී බංකර් ඇඳන් | 5,850,000.00 | 275.00 | 10% | 440,753.42 |
| 18- අප්රේල් -17 | නේවාසිකාගාර මේස | 1,788,000.00 | 275.00 | 10% | 134,712.33 |
| 18- අප්රේල් -17 | නේවාසිකාගාර පුටු | 1,140,000.00 | 275.00 | 10% | 85,890.41 |
| 29-ජූනි-17 | විධායක පුටු | 50,400.00 | 184.00 | 10% | 2,540.71 |
| 29-ජූනි-17 | පුස්තකාල කබඩ් | 75,000.00 | 184.00 | 10% | 3,780.82 |
| 29-ජූනි-17 | දොර හතරෙ කබඩ් | 32,400.00 | 184.00 | 10% | 1,633.32 |
| 29-ජූනි-17 | ලිවීමේ මේස | 24,750.00 | 184.00 | 10% | 1,247.67 |
| 29-ජූනි-17 | L හැඩය කබඩ් | 57,500.00 | 184.00 | 10% | 2,898.63 |
| 29-ජූනි-17 | ලොබි පුටු | 69,000.00 | 184.00 | 10% | 3,478.36 |
| 26-ජූලි-17 | ගොනු රාක්ක | 11,750.00 | 158.00 | 10% | 508.63 |
| 26-ජූලි-17 | L හැඩය කබඩ් | 11,500.00 | 158.00 | 10% | 497.81 |
| 28-ජූලි-17 | ලොබි පුටු | 103,500.00 | 160.00 | 10% | 4,536.99 |
| 10-අගෝස්තු-17 | ලිවීමේ මේස | 8,250.00 | 143.00 | 10% | 323.22 |
| 10-අගෝස්තු-17 | විධායක පුටු | 6,300.00 | 143.00 | 10% | 246.82 |
| 11-අගෝස්තු-17 | රෙදි කබඩ් | 40,230.00 | 142.00 | 10% | 1,565.11 |
| 19-ඔක්තෝබර් - 17 | මෙට්ට | 586,594.30 | 72.00 | 10% | 11,571.18 |
| **මුළු එකතුව** | | **16,790,221.30** | | | **1,389,690.12** |

**කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය**

**කොළඹ විශ්ව විද්‍යාලය**

**2017.12.31 දිනට යන්ත්‍ර සහ යන්ත්‍රරෝපකරණ ක්ෂයවීම් උපලේඛනය**

| යන්ත්‍ර සහ යන්ත්‍රරෝපකරණ ක්ෂයවීම් | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනීකරණය කළ දිනය | භාණ්ඩයේ නම | වටිනාකම | ක්ෂය කිරීම් කාලය (දිනය) | ක්ෂයවීම් අනුපාතය | ක්ෂයවීම් වටිනාකම |
| | ආරම්භක ශේෂය | 3,820,918.00 | | | |
| | 2017 වර්ෂයේ ක්ෂයවීම | | | | 381,953.48 |
| 27- අප්‍රේල් -17 | වායු සමීකරණය | 831,565.00 | 249.00 | 10% | 56,728.68 |
| 12- ජුනි -17 | වායු සමීකරණය | 271,975.00 | 202.00 | 10% | 15,051.77 |
| | | | | | |
| **මුළු එකතුව** | | **4,924,458.00** | | | **453,733.93** |

**කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය**

**කොළඹ විශ්ව විද්‍යාලය**

**2017.12.31 දිනට කාර්යාල උපකරණ ක්ෂයවීම් උපලේඛනය**

| කාර්යාල උපකරණ ක්ෂයවීම් | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනීකරණය කළ දිනය | භාණ්ඩයේ නම | වටිනාකම | ක්ෂය කිරීම් කාලය (දිනය) | ක්ෂයවීම් අනුපාතය | ක්ෂයවීම් වටිනාකම |
| | ආරම්භක ශේෂය | 8,341,872.00 | | | |
| | 2017 වර්ෂයේ ක්ෂයවීම | | | | 1,314,031.87 |
| 31-මාර්තු-17 | බිත්ති විදුලි පංකා | 12,200.00 | 275 | 10% | 919.18 |
| 16-ජූනි-17 | බහුකාර්ය මුද්‍රණ යන්ත්‍රය HP LaserJet | 58,300.00 | 198 | 10% | 3,162.58 |
| 21-ජූනි-17 | ලේසර් වර්ණ මුද්‍රණ යන්ත්‍රය | 11,400.00 | 193 | 10% | 602.79 |
| 27-ජූනි-17 | ඩෙස්ක්ටොප් පරිගණකය | 203,700.00 | 187 | 20% | 20,872.27 |
| 24-අගෝස්තු-17 | ජාල උපකරණ | 876,400.00 | 129 | 20% | 61,948.27 |
| 2017-02-22 | එම්බෝස් මුද්‍රාව | 25,000.00 | 312 | 10% | 2,136.99 |
| 29-දෙසැම්බර්-17 | ඩෙස්ක්ටොප් පරිගණකය | 2,186,800.00 | 2 | 20% | 2,396.49 |
| 29-දෙසැම්බර්-17 | චෙක්පත් මුද්‍රණ යන්ත්‍රය | 32,900.00 | 2 | 20% | 36.05 |
| මුළු එකතුව | | **11,748,572.00** | | | **1,406,106.50** |

**කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය**
**කොළඹ විශ්ව විද්‍යාලය**
**2017 දෙසැම්බර් මස 31 දිනට**
**විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ සඳහා වන ක්ෂය සටහන් කිරීම**

| ක්ෂයවීම් විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනීකරණය කළ දිනය | භාණ්ඩයේ නම | ප්‍රමාණය | ක්ෂය කිරීම් කාලය (දිනය) | ක්ෂයවීම් අනුපාතය | ක්ෂයවීම් ප්‍රමාණය |
| | ආරම්භක ශේෂය | 9,545,464.63 | | | |
| | 2017 ක්ෂයවීම් | | | | 769,782.49 |
| 1/1/2017 | ජල ආසවන ඒකකය | 219,880.00 | 365 | 10% | 21,988.00 |
| 6/19/2017 | ඉනිමන් | 5,000.00 | 195 | 10% | 266.39 |
| 7/3/2017 | ඉනිමන් | 5,000.00 | 150 | 10% | 204.92 |
| 8/31/2017 | වේදිකා ට්‍රොලි | 22,425.00 | 122 | 10% | 747.50 |
| එකතුව | | 9,797,769.63 | | | 792,989.31 |

**කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය**
**කොළඹ විශ්ව විද්‍යාලය**
**2017 දෙසැම්බර් මස 31 දිනට**
**ක්‍රීඩා භාණ්ඩ සඳහා වන ක්ෂය සටහන් කිරීම**

| ක්ෂයවීම ක්‍රීඩා භාණ්ඩ | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනීකරණය කළ දිනය | භාණ්ඩයේ නම | ප්‍රමාණය | ක්ෂය කිරීම් කාලය (දිනය) | ක්ෂයවීම් අනුපාතය | ක්ෂයවීම් ප්‍රමාණය |
| | ආරම්භක ශේෂය | 1,200.00 | | | |
| | 2017 ක්ෂයවීම් | | | | 120.00 |
| 12/28/2017 | කැරම් බෝඩ් | 32,000.00 | 3 | 10% | 26.30 |
| 12/28/2017 | මේස පන්දු බෝඩ් | 190,000.00 | 3 | 10% | 156.16 |
| එකතුව | | 1,200.00 | | | 302.47 |

**කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය**
**කොළඹ විශ්ව විද්‍යාලය**
**2017 දෙසැම්බර් මස 31 දිනට**
**ගෘහ උපකරණ ක්ෂයවීම් සටහන් කිරීම**

| ක්ෂයවීම් හවුස් උපකරණ | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනීකරණය කළ දිනය | භාණ්ඩයේ නම | ප්‍රමාණය | ක්ෂය කිරීම් කාලය (දිනය) | ක්ෂයවීම් අනුපාතය | ක්ෂයවීම් ප්‍රමාණය |
| | ආරම්භක ශේෂය | 372,184.00 | | | |
| | 2017 ක්ෂයවීම් | | | | 37,218.35 |
| එකතුව | | 372,184.00 | | - | 37,218.35 |

**කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය**
**කොළඹ විශ්ව විද්‍යාලය**
**2017 දෙසැම්බර් මස 31 දිනට**
**පොත් සඳහා වන ක්ෂය සටහන් කිරීම**

| ක්ෂයවීම් පොත් | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනීකරණය කළ දිනය | භාණ්ඩයේ නම | ප්‍රමාණය | ක්ෂය කිරීම් කාලය (දිනය) | ක්ෂයවීම් අනුපාතය | ක්ෂයවීම් ප්‍රමාණය |
| | ආරම්භක ශේෂය | 643,068.00 | | | |
| | 2017 ක්ෂයවීම් | | | | 64,306.80 |
| 5/4/2017 | මුදල් රෙගුලාසි සංග්‍රහය | 430.00 | 241 | 10% | 28.39 |
| එකතුව | | 430.00 | | | 64,335.19 |

**කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය**
**කොළඹ විශ්ව විද්‍යාලය**
**2017 දෙසැම්බර් මස 31 දිනට**
**වාහන සඳහා වන ක්ෂය සටහන් කිරීම**

| ක්ෂයවීම් වාහන | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනීකරණය කළ දිනය | භාණ්ඩයේ නම | ප්‍රමාණය | ක්ෂය කිරීම් කාලය (දිනය) | ක්ෂයවීම් අනුපාතය | ක්ෂයවීම් ප්‍රමාණය |
| | ආරම්භක ශේෂය | 10,439,921.00 | | 20% | |
| | 2017 ක්ෂයවීම් | | | | 1,276,224.15 |
| එකතුව | | 10,439,921.00 | | | 1,276,224.15 |

**කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය**

**කොළඹ විශ්ව විද්‍යාලය**

**2017** දෙසැම්බර් මස **31** දිනට

**විදුලි උපකරණ** සඳහා වන ක්ෂය සටහන් කිරීම

| ක්ෂයවීම් විදුලි උපකරණ | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනීකරණය කළ දිනය | භාණ්ඩයේ නම | ප්‍රමාණය | ක්ෂය කිරීම් කාලය (දිනය) | ක්ෂයවීම් අනුපාතය | ක්ෂයවීම් ප්‍රමාණය |
| | ආරම්භක ශේෂය | 83,865.00 | | | |
| | 2017 ක්ෂයවීම් | | | | 16,773.00 |
| 3/28/2017 | ඒබිසි ඔවහෙඩ් | 53,958.00 | 277 | 20% | 8,189.79 |
| **එකතුව** | | **137,823.00** | | | **24,962.79** |

**කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය**

**කොළඹ විශ්ව විද්‍යාලය**

**2017** දෙසැම්බර් මස **31** දිනට

**ගොඩනැගිලි** සඳහා වන ක්ෂය සටහන් කිරීම

| ක්ෂයවීම් ගොඩනැගිලි | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනීකරණය කළ දිනය | භාණ්ඩයේ නම | ප්‍රමාණය | ක්ෂය කිරීම් කාලය (දිනය) | ක්ෂයවීම් අනුපාතය | ක්ෂයවීම් ප්‍රමාණය |
| | ආරම්භක ශේෂය | 54,066,137.00 | | | |
| | 2017 ක්ෂයවීම් | | | | 2,703,306.85 |
| 2017-04-06 | නව විද්‍යාත ගොඩනැගිල්ල | 24,791,520.41 | 269 | 5% | 913,550.55 |
| එකතුව | | 78,857,657.41 | | | 3,616,857.40 |

**කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය**

**කොළඹ විශ්ව විද්‍යාලය**

**2017** දෙසැම්බර් මස **31** දිනට

නේවාසිකාගාරය සඳහා වන ක්ෂය සටහන් කිරීම

| ක්ෂයවීම් නේවාසිකාගාරය | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනීකරණය කළ දිනය | භාණ්ඩයේ නම | ප්‍රමාණය | ක්ෂය කිරීම් කාලය (දිනය) | ක්ෂයවීම් අනුපාතය | ක්ෂයවීම් ප්‍රමාණය |
| | ආරම්භක ශේෂය | 222,422,928.00 | | | |
| | 2017 ක්ෂයවීම් | | | | 11,121,146.40 |
| එකතුව | | 222,422,928.00 | | | 11,121,146.40 |

**කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය**

**කොළඹ විශ්ව විද්‍යාලය**

**2017 දෙසැම්බර් මස 31 දිනට**

**ගොඩනැගිලි ද්‍රව්‍ය පුනරුත්ථාපනය සඳහා වන ක්ෂය සටහන් කිරීම**

| ක්ෂයවීම් ගොඩනැගිලි ද්‍රව්‍ය පුනරුත්ථාපනය | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනීකරණය කළ දිනය | භාණ්ඩයේ නම | ප්‍රමාණය | ක්ෂය කිරීම් කාලය (දිනය) | ක්ෂයවීම් අනුපාතය | ක්ෂයවීම් ප්‍රමාණය |
| 2017-02-20 | ගොඩනැගිලි ද්‍රව්‍ය | 209,687.00 | 314 | 5% | 9,019.41 |
| 2017-12-13 | ගොඩනැගිලි ද්‍රව්‍ය | 4,068,327.72 | 18 | 5% | 10,031.49 |
| 2017-09-22 | ගොඩනැගිලි ද්‍රව්‍ය | 724,061.85 | 100 | 5% | 9,918.66 |
| එකතුව | | 5,002,076.57 | | | 28,969.56 |

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/බී/අයිඒආර්එස්/6/17/06 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2018 නොවැම්බර් 09 දින


අධ්‍යක්ෂක

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

**කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2008 අංක 02 දරන කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලියේ 27 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2008 අංක 02 දරන කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලියේ 27 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


Accounts
2 1 NOV 2018
Division
Institute for Agro - Technology & ...



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

----------------------

ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව පර්යේෂණාගාර හා ඉගැන්වීම් උපකරණවලට අදාළ ඵලදායී ජීවිත කාලය වසර 5 ක් ලෙස හඳුනාගෙන තිබුණද ක්ෂය ගණනය කිරීමේදී වසර 10 ක් ලෙස සලකා සියයට 10 අනුපාතය යොදාගෙන ක්ෂය කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වටිනාකම රු.792,989 කින් අඩුවෙන් දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැය නොකළ වෙනත් ප්‍රාග්ධනවලට අදාල රු.222,000 ක් වටිනා ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම් වැයකළ වෙනත් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට හර කිරීම වෙනුවට වැයකළ ප්‍රාග්ධන ගිණුමට හර කර තිබුණි.

(ආ) වෙනත් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.1,600,000 ක මුදලින් අයභාර වියදම් වෙනුවෙන් රු.678,000 ක් වැයකර තිබුණි.

(ඇ) ප්‍රාග්ධන ප්‍රදානවලින් දරන ලද පුනරාවර්තන ස්වරූපයේ වියදම් රු.1,235,052 ක් මූල්‍ය ප්‍රකාශනවල අයභාර වියදම් යටතේ දක්වා තිබුණද ඊට සමාන වටිනාකමක් ආදායම ලෙස හඳුනා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ඉල්ලුම් තැන්පතුවකට අදාළව 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී ආදායම රු.1,067,546 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති අගය රු.1,018,023 ක් වූයෙන් ලැබිය යුතු පොලිය රු.49,523 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාළ ආයෝජන සඳහා වන පොලී ආදායම රු.3,852,691 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එම ආදායම රු.3,958,365 ක් ලෙස රු.105,674 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පරීක්ෂාවේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2017 වර්ෂය තුළ ස්ථාවර තැන්පතු ආපසු ලබා ගැනීම් රු.75,324,949 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.1,537,339 ක් ලෙස ගලපා තිබීමෙන් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒම රු.73,787,610 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට අනුව වර්ෂයේ පොලී ආදායම රු.3,968,763 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.3,958,365 ක් ලෙස ගලපා තිබුණි.

(iii) ගොවීන් වෙත ණය ලබාදීම සඳහා ගොවීන්ගේ භාරකාර අරමුදලෙන් විශ්වවිද්‍යාලය වෙත ණය මුදලක් ලබා දී තිබූ අතර 2017 වසර තුළ එම ණය මුදලට අදාළව ගොවීන්ගෙන් රැස්කල රු.730,250 ක් ලැබීම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

(iv) ගොවීන්ගේ භාරකාර අරමුදලට ආයතනය ප්‍රේෂණය කළ වටිනාකම රු.1,105,000 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අරමුදලට ගෙවූ මුදල ලෙස රු.1,041,666 ක් දක්වා තිබීමෙන් රු.63,334 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාළව 2018 වර්ෂය තුළ කරන ලද ගෙවීම් වටිනාකම රු.614,319 ක් වුවද 2017 දෙසැම්බර් 31 දිනට එම බැරකම උපචිත වියදම් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ඌ) 2017 දෙසැම්බර් 31 දිනට ඉතිරි කෙසෙල් පැල තොගය 20,178 ක් වූ අතර තොග ඒකකයක පිරිවැය රු.61.89 ක් වූ බැවින් අවසන් තොගයේ වටිනාකම රු.1,248,816 ක් විය යුතුය. එසේ වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි අවසන් තොගය ලෙස රු.1,510,073 ක් දක්වා තිබීමෙන් තොග වටිනාකම රු.261,257 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 නොසැසඳු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ ලෙජර් ගිණුම් 05 ක ලෙජරය අනුව ශේෂයත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයත් අතර රු.1,209,385 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

ගස්ලබු පැල අලෙවි ආදායම පරීක්ෂා කිරීමේදී මාසික සාරාංශ වාර්තා අනුව ආදායම් එකතුව රු.19,435,025 ක් වූවත් මූල්‍ය ප්‍රකාශන අනුව ආදායම රු.19,367,245 ක් වූයෙන් 2017 දෙසැම්බර් 31 දිනට අලෙවි ආදායමෙහි රු.67,780 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගොවීන්ගේ භාරකාර අරමුදල මඟින් ආයතනය විසින් ගොවීන් 06 දෙනෙකු වෙත ලබාදී තිබුණු රු.1,000,000 ක් වටිනා ණය මුදලින් රු.908,280 ක ශේෂයක් 2015 වර්ෂයේ සිට අය නොවී පැවති බව නිරීක්ෂණය විය.

(ආ) ග්‍රාමීය ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ ආයතනය විසින් පුද්ගලයින් දෙදෙනෙකු වෙත 2012 වර්ෂයේ ලබා දී තිබුණු රු.208,000 ක ණය මුදලින් රු.35,860 ක ණය ශේෂයක් 2015 වර්ෂයේ සිට අය නොවී පැවති බව නිරීක්ෂණය විය.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

1995 ජුලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේදී එම විභාගය පැවැත්වූ දින සිට මාස 03 ක් ඇතුළත එහි ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවත් ආයතනය විසින් පවත්වා තිබුණු විභාග 13 ක ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස 05 සිට මාස 10 දක්වා කාලයක් ගත කර තිබූ බව නිරීක්ෂණය විය.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.1,201,286 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.10,828,494 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,029,780 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන වලින් මිලදී ගත් ප්‍රාග්ධන වත්කම් සඳහා වන ක්‍රමක්ෂය රු.13,164,940 කින් ඉහල යාම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී වර්ධනයක හා පසුබෑමක සංකලනයක් දක්නට ලැබෙන අතර 2013 වර්ෂයේ පැවති රු.6,301,901 ක අතිරික්තය 2017 වර්ෂය වන විට රු.1,201,286 ක් දක්වා අඩු වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ක්ෂය වීම් නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.14,477,841 ක් වූ ආයතනයේ දායකත්වය උච්ඡාවචනයන් සහිතව 2017 වර්ෂයේ දී රු.41,806,913 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෘෂි තාක්ෂණවේදී උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වන ශිෂ්‍ය සංඛ්‍යාව උපාධි පාඨමාලාව සම්පූර්ණ කරන ශිෂ්‍ය සංඛ්‍යාව සමග සැසඳීමේදී පාඨමාලාව සඳහා 2009 හා 2010 වර්ෂවලදී ලියාපදිංචි පළමු හා දෙවන ශිෂ්‍ය කණ්ඩායමේ සිසුන් ගණන පිළිවෙලින් 60 හා 67 ක් වුවද උපාධි පාඨමාලාව අවසන් කරනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 09 ක් හා 11 ක් විය. එනම් ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් පිළිවෙලින් සියයට 15 ක් සියයට 16 ක් වැනි අඩු ප්‍රමාණයක් උපාධිය අවසන් කර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ආයතනයේ එක් එක් ශිෂ්‍ය කණ්ඩායම්වල ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවත් ඩිප්ලෝමා අදියර අවසන් කරන ශිෂ්‍ය සංඛ්‍යාවත් ප්‍රතිශතාත්මකව සංසන්දනය කිරීමේදී පසුගිය වර්ෂ 6 ක් තුළ ශිෂ්‍ය කණ්ඩායම් 6 ක ඩිප්ලෝමා අදියර අවසන් කර ඇති ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 21 සිට සියයට 56 ක අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය පිළිබඳ කාර්යසාධන දර්ශක පරීක්ෂාවේදී කාර්යසාධන දර්ශක 37 කින් අටක කිසිදු ප්‍රගතියක් සිදුවී නොතිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව අපේක්ෂිත කාර්යයන් කාර්යක්ෂමව ඉටු වී නොතිබුණි.

(ඈ) ගස්ලබු පැලවල මාසික නිෂ්පාදනය හා අලෙවිය සැසඳීමේදී නිෂ්පාදනයට සාපේක්ෂව අලෙවියක් දක්නට නොවීය. ඒ අනුව මාසික නිෂ්පාදනය තුළින් වැඩි පැල ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. වර්ෂය පුරා මාසික අලෙවිය සියයට 4 සිට සියයට 62 දක්වා පහළ අගයක් ගෙන තිබුණු අතර තොග ඉතිරිය සියයට 26.4 සිට සියයට 95 දක්වා ඉහළ අගයක් ගෙන තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් ගොවීන්ගේ භාරකාර අරමුදල හා ග්‍රාමීය ව්‍යවසාය වැඩසටහන යටතේ ණය වැඩසටහන් දෙකක් පවත්වා ගෙන යන අතර එම ණය මුදල් ප්‍රදානය කිරීමේදී ගොවීන් හා භාරකාර අරමුදල අතර විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. එම ණය මුදල් නැවත අයකර ගැනීමේ නිශ්චිත වූ ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන් ලබා දෙන ණය අයකර ගැනීම සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් පැන නැගී තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 2014 දෙසැම්බර් 26 දින ආයෝජනය කර තිබූ රු.10,120,895 ක් වටිනා ඉල්ලුම් තැන්පතුව 2018 සැප්තැම්බර් 21 විගණිත දිනය දක්වාම එසේ පැවති අතර ආයෝජනය කළ දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා ලැබිය යුතු ආයෝජන ආදායම රු.1,067,546 ක් විය. මෙම මුදල ස්ථාවර තැන්පතුවක ආයෝජනය කළේ නම් දළ වශයෙන් ලබාගත හැකිව තිබුණු පොලී ආදායම රු.2,159,874 කි. ඒ අනුව ආයතනයට ආසන්න වශයෙන් රු.1,092,328 ක ආදායමක් අහිමි වී තිබුණු බව නිරීක්ෂණය කෙරේ.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේ ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 26 ක් වන අතර තත්‍ය කාර්ය මණ්ඩලය නිලධාරීන් 08 ක් විය. ඒ අනුව සමස්ත කාර්ය මණ්ඩල ඌනතාවය 18 ක් වන අතර ඒ තුල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු, කථිකාචාර්යවරුන් දෙදෙනෙකු හා තාවකාලික ශිල්ප ප්‍රදර්ශක (Temporary Demonstrators) එක් තනතුරක ඌනතාවයක් පැවතුණි.

(ආ) 2017 වර්ෂයේදී ආයතනය විසින් කාර්ය පැවරුම් පදනම මත සේවකයන් 55 දෙනෙකු සේවයේ යොදාගෙන තිබූ අතර එම සේවකයින් වසර 01 සිට වසර 18 ක් ආයතනයට සේවය කර තිබූ බව නිරීක්ෂණය විය. මේ සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගෙන තිබුණද කාර්ය මණ්ඩල අවශ්‍යතාවය සංශෝධනයකින් තොරව කාර්ය මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයින් 41 ක් සේවයේ යොදවා තිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නේවාසිකාගාර 60 ව්‍යාපෘතිය යටතේ රු.220,096,952 ක් වැයකර 2014 වර්ෂයේදී කාමර 100 කින් සමන්විත සිසුන් 400 කට නවාතැන් ගතහැකි නේවාසිකාගාරයක් ආයතනය තුළ ඉදිකර තිබූ අතර එය 2014 වර්ෂයේදී ආයතනනයට පවරා තිබුණි. 2017 වර්ෂයේ එක් එක් මාසය තුළ කාමර භාවිතය පරීක්ෂාවේදී භාවිතයට ගෙන තිබුණු උපරිම කාමර ගණන 32 ක් විය. දිනකට උපරිම වශයෙන් නේවාසිකව සිටි සිසුන් ගණන 77 ක් වූ අතර සිසුන් අඛණ්ඩව නේවාසිකව නොසිටින බව නිරීක්ෂණය විය. 2018 සැප්තැම්බර් 28 විගණිත දිනය වන විටත් මෙම නේවාසිකාගාරය උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව භාවිතයට ගැනීමට ආයතනයට නොහැකි වී තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම**

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳ දැනුවත් වී නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**6.1 ප්‍රසම්පාදනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණද ඒ සඳහා ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණ කළ යුතු දින වකවානු ඇතුළත් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. ඒ අනුව ප්‍රසම්පාදනයන් නිශ්චිතව හඳුනාගත නොහැකි වූ අතර සැලැස්ම සමග සැසදීමට නොහැකි වීම සහ කාලසටහන ඇතුළත සම්පූර්ණ කර තිබූ බව විගණනයට තහවුරු කරගත නොහැකි විය.

(ආ) නියැදි පරීක්ෂාවේදී වටිනාකම රු.638,250 ක් වූ දේශන ශාලා සඳහා පුටු 75 ක් මිලදී ගැනීම අදාළ අංශයෙන් භාණ්ඩ ඉල්ලුම් කළ දිනයේ සිට සැපයුම්කරුගෙන් භාණ්ඩ ඇණවුම් කිරීම දක්වා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දින 125 ක කාලයක් ගත වී තිබුණු අතර රු.58,300 ක් වටිනා මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීමේදී ද මෙම ක්‍රියාවලිය සඳහා දින 202 ක පමණ කාලයක් ගතවී තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු වල ප්‍රමාදයන් පැවති බව නිරීක්ෂණය විය.

## 6.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය හා තත්‍ය ආදායම් හා වියදම් සැසඳීමේදී අභ්‍යන්තරව ඉපයූ ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 81.9 කින් අඩු වී තිබූ අතර වියදම් විෂයයන් 06 ක අයවැය ගත ප්‍රතිපාදනය ඉක්මවා සියයට 44 සිට සියයට 433 දක්වා වැය කර තිබූ බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) පැල නිෂ්පාදනය සහ අලෙවිය | අලෙවිය පිළිබඳව පුරෝකථනය සිදුකර පැල නිෂ්පාදනය නොකිරීම, නිෂ්පාදනයන් සහ අලෙවිය සැලසුම් කර නොතිබීම, අනෙකුත් නිෂ්පාදනයන් සඳහා නිෂ්පාදන ගිණුම් සකස් නොකිරීම. |
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | (i) කාර්ය මණ්ඩල අවශ්‍යතා අනුව අනුමත කාර්ය මණ්ඩල සංශෝධනය කර නොගැනීම සහ පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |
| | (ii) ආයතන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නිවැරදි තොරතුරු ඇතුලත් කර පවත්වා නොගැනීම |
| (ඇ) තොග අගය කිරීම | පැල තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය අනුව තොග අගය නොකිරීම. |
| (ඈ) ණය පාලනය | ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

# 2017 විගණකාධිපති වර්තාව සඳහා පිලිතුරු

## කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

| විගණන වාර්තා වේ ඡේද අංකය | විගණන විමසුමෙහි සඳහන් කරුණ | විගණන විමසුම සඳහා පිළිතුරු |
|---|---|---|
| **2.2** | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම | |
| **2.2.1** | ගිණුම්කරණ ප්‍රතිපත්ති<br>පර්යේෂණාගාර හා ඉගැන්වීම් උපකරණවලට අදාළ ක්ෂය සියයට 20 වුවත් ක්ෂය ගණනය කිරීමේදී සියයට 10 අනුපාතය යොදාගෙන තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වටිනාකම රු.792,989 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඔබගේ නිරීක්ෂණයන් සමඟ එකඟ වේ. මේ සම්බන්ධයෙන් නිවැරදි ගැලපීම් 2018 වර්ෂයෙන් සිදු කරන බව දන්වා සිටිමි. |
| **2.2.2** | ගිණුම්කරණ අඩුපාඩු<br><br>(අ) වැය නොකළ වෙනත් ප්‍රාග්ධන වලට අදාළ රු.222,000 ක් වටිනා වත්කම් මිලදී මිලදී ගැනිම් වැයකළ වෙනත් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට හර කිරිම වෙනුවට වැයකළ ප්‍රාග්ධන ගිණුමට හර කර තිබුණි. | ඔබගේ නිරීක්ෂණයන් සමඟ එකඟ වේ. ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි වැය කල ප්‍රාග්ධන ගිණුමේ වෙනස වන රු. 222,000 ක මුදල Other GrantSpent යටතේ දැක්විය යුතු වුවද සියළු ප්‍රාග්ධන අරමුදල් එකම ප්‍රාග්ධන අරමුදල් ගිණුමක් යටතේ අප ආයතනය විසින් පවත්වාගෙන යන හෙයින් වැයකල ප්‍රාග්ධන ගිණුමේ මෙම වෙනස අනාවරණය වේ. මෙය Other GrantSpent යටතේ දැක්විය යුතු වුවද වැය කල ප්‍රාග්ධන ගිණුම යටතේම පෙන්වා ඇත. එයට හේතුව තනි ප්‍රාග්ධන අරමුදල් ගිණුමක් පවත්වාගෙන යාමයි. 2018 වර්ෂයේදී මෙම තත්වය නිවැරදි කරන බවට දන්වා සිටිමි. |
| | **(ආ)** වෙනත් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.1,600,000 ක මුදලින් අයහාර වියදම් වෙනුවෙන් රු.678,000 ක් වැය කර තිබුණි. | ඔබගේ නිරීක්ෂණයන් සමඟ එකඟ වේ. ඉහත (අ) i යටතේ පෙන්වා දී ඇති තොරතුරු මේ සඳහාද අදාල වේ. එනම් සියළු ප්‍රාග්ධන අරමුදල් සඳහා තනි ප්‍රාග්ධන ගිණුමක් පවත්වාගෙන යාම හේතුවෙන් මේ තත්වය පැන නැගී ඇත. 2018 වර්ෂයේ මෙම ගිණුම තුළ සිදු වී ඇති වෙනස නිවැරදි කරන බව දන්වා සිටිමි. |
| | (ඇ) ප්‍රාග්ධන ප්‍රදාන වලින් දරන ලද පුනරාවර්තන ස්වරූපයේ වියදම් රු.1,235,052 ක් මූල්‍ය ප්‍රකාශන අයහාර වියදම් යටතේ දක්වා තිබුනද මුල ඊට සමාන වටිනාකමක් ආදායම ලෙස හඳුනා නොගැනිම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඔබගේ නිරීක්ෂණය සමග එකග වෙමි. 2018 වර්ෂයේ සිට නිවැරදි වැය ශීර්ෂ හරහා අදාළ ගෙවීම් සිදු කරන බව දන්වා සිටිමි. |

| | | |
|---|---|---|
| | (ඇ) ඉල්ලුම් තැන්පතුවට අදාළ 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී ආදායම රු.1,067,546 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති අගය රු.1,018,023 ක් වුයෙන් ලැබිය යුතු පොලීය රු.49,523 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඔබගේ නිරීක්ෂණයන් සමඟ එකඟ වේ. රු. 49,523.45 ක ලැබිය යුතු පොළිය අඩුවෙන් දැක්වීම ගණනය කිරීම් දෝෂයකින් ඇති වුවක් බව සඳහන් කරමි. 2018 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කරන බව දන්වා සිටිමි. |
| | **(ඉ)** සමාලෝචිත වර්ෂයට අදාළ ආයෝජන ආදායමේ අගය රු3,852,691 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එම ආදායම රු.3,958,365 ක් ලෙස රු.105,674 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඔබගේ නිරීක්ෂණයන් සමඟ එකඟ වේ. 2017 ගිණුම් පිළියෙල කිරීමේදී අදාල තොරතුරු ගිණුම් ප්‍රකාශන වලට ඇතුළත් කිරීමේදී සිදු වූ වැරද්දකි. 2018 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කරන බව දන්වා සිටිමි. |
| **(ඊ)** | (i) 2017 වර්ෂය තුළ ස්ථාවර තැන්පතු අපාසු ගැනිම රු.75,324,949 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.1,537,339 ක් ලෙස ගලපා තිබිමෙන් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒම රු.73,787,610 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඔබගේ නිරීක්ෂණයන් සමඟ එකඟ වේ. අවසන් ගිණුම් පිළියෙල කිරිමේදි ස්ථාවර තැන්පතු ශේෂයන් බැංකු මුදල් ශේෂය තුල ඇතුලත් කර ඇත.එබැවින් මෙම වෙනස අයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ලෙස වර්තා වී නොමැත. 2018 වර්ෂයේ අවසන් ගිණුම් තුල මෙය නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| | (ii) 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට අනුව වර්ෂයේ පොලී ආදායම රු.3,968,763 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පොලී ආදායම රු.3,958,365 ක් ලෙස ගලපා තිබීමෙන් පොලී ආදායම රු.10,398 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඔබගේ නිරීක්ෂණය සමඟ එකඟ වෙමි.2018 වර්ෂයේ අවසන් ගිණුම් තුල මෙය නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| | (iii) ගොවීන්ගේ භාරකාර අරමුදලෙන් ගොවීන්ට ණය ලබාදෙන අතර ඔවුන් විසින් ආපසු ගෙවන ණය මුදල් වාරික එම අරමුදලට බැර කරනු ලබයි. එසේ බැර කළ මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබු නමුත් 2017 වසර තුළ එම ණය මුදලට අදාළව ගොවීන්ගෙන් රැස් කළ රු.730,250 ක මුදල ලැබීම් ප්‍රවාහයක් ලෙස දක්වා නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණයන් සමඟ එකඟ වේ. 2018 වර්ෂයේ අවසාන ගිණුම් තුළින් නිවැරදි කරන බව දන්වා සිටිමි.තවද මෙම මුදල් ලැබිම් ප්‍රවාහයන් මෙහෙයුම් කටයුතු තුලින් ලද මුදල් ලෙස වැරදිමකින් ඇතුලත් කර ඇති අතර මෙය 2018 වර්ෂයේ අවසන් ගිණුම් තුල ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ලෙස නිවැරදිව ඇතුලත් කිරිමට අදාල කටයුතු කරමි. |
| | (iv) ගොවින්ගේ භාරකාර අරමුදලට ආයතනය ප්‍රේෂණය කළ වටිනාකම රු.1, 105,000 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුදලට ගෙවූ මුදල ලෙස රු.1, 041,666 ක් දක්වා තිබීමෙන් රු.63,334 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඔබගේ නිරීක්ෂණයන් සමඟ එකඟ වේ. අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී මෙම රු. 63,334 ක පොළී ආදායම මඟ හැරීමකින් ගිණුම් තුළට ඇතුළත් වී නොමැත. 2018 වර්ෂයේ අවසාන ගිණුම් තුළින් නිවැරදි කරන බව දන්වා සිටිමි. |
| | (උ)සමාලෝචිත වර්ෂයට අදාළව 2018 වර්ෂය තුළ කරන ලද ගෙවීම් වටිනාකම රු.614,319 ක් වුවද 2017 දෙසැම්බර් 31 දිනට එම බැරතම උපචිත වියදම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණය සමග එකග වෙමි. මෙම 2017 වර්ෂයට අදාල වියදම් 2018 වර්ෂය සඳහා වෙන් කරන ලද මුදල් වලින් ගෙවීම් සිදු කර ඇත. එම නිසා එම වියදම් උපචිත වියදම් ලෙස හඳුනා නොගෙන 2018 වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර ඇත. |

| | | |
|---|---|---|
| | (ඌ)2017 දෙසැම්බර් 31 දිනට ඉතිරි කෙසෙල් පැල තොගය පැල 20,178 ක් වූ අතර තොග ඒකකයක පිරිවැය රු.61.89 ක් වීමෙන් අවසන් තොගයේ වටිනාකම රු.1,248,816 ක් විය යුතුය. එසේ වුවද මූල්‍ය ප්‍රකාශයන්හි අවසන් තොගය ලෙස රු.1,510,073 ක් දක්වා තිබීමෙන් තොග වටිනාකම රු.261,257 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඔබගේ නිරීක්ෂණයන් සමඟ එකඟ නොවේ. 2017 දෙසැම්බර් 31 දිනට අදාලව ඉතිරි පැල තොගයන් ලබා ගන්නා ලද්දේ 2017 භෞතික භාණ්ඩ සමීක්ෂණ වාර්තා තුළිනි. එමෙන්ම තොග ඒකකයක මිළ රු. 73.47 වටිනාකම ගණනය කරන ලද්දේ නිෂ්පාදන ගිණුම තුළින් ගණනය කරන ලද කෙසෙල් පැල වල පිරිවැය අදාල කෙසෙල් පැල සංඛ්‍යාව හා සැසඳීමෙනි. |
| **2.2.3** | <u>නොසැසඳූ පාලන ගිණුම්</u><br><br>සමාලෝචිත වර්ෂයේ ලෙජර් ගිණුම් 05 ක ලෙජරය අනුව ශේෂයත් මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති ශේෂයත් අතර රු.1,209,385 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඔබගේ නිරීක්ෂණය සමග එකඟ වෙමි. මේ වන විට මෙම ලෙජර් ගිණුම් තුලනය කර ඇත. |
| **2.2.4** | <u>පැහැදිලි නොකල වෙනස්කම්</u><br><br>ගස්ලබු පැල අලෙවි ආදායම පරීක්ෂා කිරීමේදී මාසික සාරාංශ වාර්තා අනුව ආදායම් එකතුව රු.19,435,025 ක් වූවත් මූල්‍ය ප්‍රකාශන අනුව ආදායම රු.19,367,245 ක් වීමෙන් 2017 දෙසැම්බර් 31 දිනට අලෙවි ආදායමෙහි රු.67,780 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඔබගේ නිරීක්ෂණයන් සමඟ එකඟ නොවේ. අලෙවි ආදායම මාසික සාරාංශ වාර්තා වලට වඩා පිළිගත හැකි වන්නේ මූල්‍ය අංශයේ ඇති සත්‍ය වශයෙන් භෞතිකව ලද මුදලේ වටිනාකමට අදාලව නිකුත් කරන ලද රිසිට් පත් වල වටිනාකම සහ එම අලෙවි ආදායම් සම්බන්ධයෙන් මහජන බැංකුව හම්බන්තොට ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 007100146432005 දරණ ගිණුමේ තැන්පත් කරන ලද මුදල අනුවය. එකී ගිණුම් ශේෂයන් පරීක්ෂා කිරීමේදී 2017 වර්ෂයේ අලෙවි ආදායම ලෙස පෙන්වා දී ඇත්තේ රු. 19,367,245 ක මුදලකි. |
| **2.3** | <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u><br><br>(අ) ගොවීන්ගේ භාරකාර අරමුදල මඟින් ගොවීන් 06 දෙනෙකු වෙත ලබාදී තිබුණු රු.1,000,000 ක් වටිනා ණය මුදලින් රු.908,280 ක ශේෂයක් 2015 වර්ෂයේ සිට අය නොවී පැවති බව නිරීක්ෂණය විය. | ඔබගේ නිරීක්ෂණය සමග එකඟ වෙමි. දැනට මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ආයතනය විසින් කටයුතු කර ගෙන යනු ලැබේ. |
| | (ආ) ග්‍රාමීය ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ පුද්ගලයින් දෙදෙනෙකු වෙත 2012 වර්ෂයේ ලබාදුන් 208,000 ක් වටිනා ණය මුදලින් 35,860 ක ණය ශේෂයක් 2015 වර්ෂයේ සිට අය නොවී පැවති බව නිරීක්ෂණය විය. | ඔබගේ නිරීක්ෂණය සමග එකඟ වෙමි. දැනට මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ආයතනය විසින් කටයුතු කර ගෙන යනු ලැබේ. |

| | | |
|---|---|---|
| | **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**<br><br>1995 ජූලි 14දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේදී එම විභාගය පැවැත්වූ දින සිට මාස 03 ක් ඇතුළත එහි ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවත් ආයතනය විසින් පවත්වා තිබුණු විභාග 13 ක ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස 05 සිට මාස 10 දක්වා කාලයක් ගත කර තිබූ බව නිරීක්ෂණය විය. | උපාධි පාඨමාලාව සඳහා සහතික පත්‍ර පාඨමාලා 17 ක් පවතින අතර සෑම සහතික පත්‍ර පාඨමාලාවක් ආරම්භ වී මාස 03 කින් පසුව විභාගය පැවැත් වේ. පාඨමාලාව සඳහා කණ්ඩායම් 09 ක් සිටින අතර ඒ සියලූ කණ්ඩායම් සඳහා විභාග පැවැත්වීමේදී විශාල විභාග ප්‍රමාණයක් එක් වර සිදු කිරීමට සිදුවේ. මේ සියලූ දේ සඳහා ආයතනය සතුව අධ්‍යයන කාර්ය මණ්ඩලය 08 දෙනෙකු පමණක් ඇති අතර (02 ස්ථිර, 06 තාවකාලික) එය මේ සඳහා ප්‍රමාණවත් නොවේ.<br><br>අධ්‍යන කාර්යය මණ්ඩලය වැඩිකර ගැනීම සඳහා පියවර ගනිමින් ඇත.<br><br>තවද විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සිදුකරනුයේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය පවත්නා දිනයේදී වන අතර අනධ්‍යයන කාර්යය මණ්ඩල වැඩ වර්ජනය හේතුවෙන් මේ කාල සීමාව තුල කළමනාකරණ මණ්ඩල කිහිපයක් තිබීමට නොහැකි විය. එබැවින් සමහර විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මෙය බාධාවක් විය.<br><br>මේ වන විට ආයතනය තුල විභාග ප්‍රතිඵල මණ්ඩලයක් ස්ථාපිත කර ප්‍රතිඵල නිකුත් කිරිම සඳහා කටයුතු කර ඇති අතර එයින් මෙය මගහරවාගත හැකිවනු ඇත.<br><br>තවද මෙම කාල සීමාව තුල පාඨමාලාවේ විෂයමාලා සංශෝධනයක් සිදුවූ අතර semester ක්‍රමයට විෂයමාලා සකස් කර ඒ සඳහා නව සිසුන් බඳවා ගැනුනි. එබැවින් එකවර විෂයමාලා දෙකක වැඩකටයුතු කිරීමට සිදු වූ බැවින් යම් ප්‍රමාදයක් සිදුවිය. අධ්‍යන කාර්යය මණ්ඩලය හිඟතාවයද මෙයට බලපෑ හේතුවක් විය.<br><br>නමුත් ඉදිරියේදී ප්‍රතිඵල නිකුත් වීම සිදුවනුයේ සමාසික ආකාරයෙන් වන නිසා සියලු විෂයන්හි ප්‍රතිඵල එක්කර නියමිත කාලයේදී නිකුත් කිරිමට හැකිවනු ඇත. |
| **4.** | **මෙහෙයුම් සමාලෝචනය** | |
| **4.1** | **කාර්යසාධනය** | |

| | | |
|---|---|---|
| **4.1.1** | <u>ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය</u><br><br>(අ) කෘෂි තාක්ෂණවේදී උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වන ශිෂ්‍ය සංඛ්‍යාව උපාධි පාඨමාලාව සම්පූර්ණ කරන ශිෂ්‍ය සංඛ්‍යාව සමග සැසදීමේදී පාඨමාලාව සඳහා ලියාපදිංචි පළමු හා දෙවන ශිෂ්‍ය කණ්ඩායමේ සිසුන් ගණන පිළිවෙලින් 60 හා 67 ක් වුවද උපාධි පාඨමාලාව අවසන් කරනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 09 ක් හා 11 ක් විය. එනම් ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් පිළිවෙලින් සියයට 15 ක් සියයට 16 ක් වැනි සුළු පිරිසක් උපාධිය ලබාගන්නා බව නිරීක්ෂණය විය. | <br><br>කෘෂි තාක්ෂණවේදී උපාධි පාඨමාලාව අදියර තුනකින් පැවැත් වූ අතර ලියාපදිංචි වූ සංඛ්‍යාවෙන් පිරිසක් ඩිප්ලෝමාව අවසන් කර ඉවත් වූ අතර තවත් පිරිසක් උසස් ඩිප්ලෝමාව හඳාරා ඉවත් විය.<br><br>දැනට පවතින Bylaws වලට අනුව උපාධි පාඨමාලාවේ ඇති අදියර තුනෙන් එක් අදියරක සිට අනෙක් අදියරට (ඩිප්ලෝමා සිට උසස් ඩිප්ලෝමාව සහ උසස් ඩිප්ලෝමාවේ සිට උපාධි පාඨමාලාව) ඇතුලුවීම සඳහා සාධන මට්ටමක් (2.75GPA) සලකා බලන අතර එම මට්ටමට ලගා වීමට නොහැකිවීම නිසා එක් අදියරක සිට අනෙක් අදියරට යන ශිෂ්‍ය සංඛ්‍යාවේ අඩුවීමක් සිදු වේ. මෙයට පිලියමක් ලෙස පවතින Bylaws සංශෝධනය කිරීම සිදුකර ඇත. |
| | (ආ) ආයතනයේ එක් එක් ශිෂ්‍ය කණ්ඩායම්වල ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවත් ඩිප්ලෝමා අදියර අවසන් කරන ශිෂ්‍ය සංඛ්‍යාවත් ප්‍රතිශතාත්මකව සංසන්දනය කිරීමේදී එහි දිගින් දිගටම අඩුවීමක් නිරීක්ෂණය විය. | බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අතරමග අතහැර දැමීමට බලපාන කරුණු සම්බන්දව අධ්‍යයන අංශය විසින් සමීක්ෂණයක් සිදුකර ඇති අතර එයට හේතු ලෙස අනාවරණය වුවේ.<br>•ආයතනය සතුව අධ්‍යයන පාඨමාලා සඳහා ප්‍රමාණවත් මානව හා යටිතල පහසු කම් සංවර්ධනයක් නොමැති වීම.<br>•පාඨමාලා ගාස්තු ගෙවීමට නොහැකි වීම.<br>•ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීමට අපහසු වීම.<br>•පෞද්ගලික ගැටලු හේතුවෙන් අතහැර දැමීමට සිදුවීම.<br>ආදී දේ ප්‍රධාන කාරණා ලෙස දක්වා තිබුණි.<br>ආයතනයේ යටිතල පහසුකම් මේ වන විට සංවර්ධනය වෙමින් පවතින නිසාත් පාඨමාලවේ විෂයමාලා සංශෝධනයක් කර ඇති නිසාත් මෙය ඉදිරියේ දී යම් ප්‍රමාණයකට වැඩිකරගත හැකිවනු ඇත. |
| | (ඇ) ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය පිලිබඳ කාර්යසාධන දර්ශක පරීක්ෂාවේදී කාර්යසාධන දර්ශක 37 කින් 8 ක කිසිදු ප්‍රගතියක් සිදු වී නොතිබූ බව නිරීක්ෂණය විය.ඒ අනුව අපේක්ෂිත කාර්යයන් කාර්යක්ෂමව ඉටු වී නොතිබුණි. | උපායශිලි සැලැස්මේ දක්වා ඇති කිසිදු ප්‍රගතියක් සිදුවී නොතිබූ කාර්යසාධන දර්ශක 8 න් 4ක්ම ඉටු කර ගැනීමට නොහැකි වී ඇත්තේ ප්‍රාග්ධන අරමුදල් ප්‍රමාණවත් පරිදි ආයතනයට අනුමත නොවීම නිසාය.<br>එසේම උපායශීලී සැලැස්මේ තෙවන අරමුණ යටතේ ආයතනය කෘෂි ව්‍යවසායකයින්ට මූල්‍ය සහයෝගය ලබා දීම 2017 වර්ෂයේ සිට කළමනාකරණ මණ්ඩල අනුමැතිය සහිතව අත්හිටුවා ඇති බැවින් එම අරමුණ යටතේ ඇති කාර්යසාධන දර්ශක 2ක ප්‍රගතියක් නොමැති අතර එම දර්ශක 2018 වර්ෂයේ උපායශීලී සැලැස්මෙන් ඉවත් කර ඇත.<br><br>අනෙකුත් ප්‍රගතියක් සිදුවී නොමැති කාර්යසාධන දර්ශක 2 (කෙටි පාඨමාලා හඳුන්වා |

| | | |
|---|---|---|
| | | දීම සහ crop clinics පැවැත්වීම) ඉදිරි වර්ෂයේ දී ඉටු කර ගැනීමට අපේක්ෂා කෙරේ. |
| | (ඇ) ගස්ලබු පැල නිෂ්පාදනයේදී ද මාසික නිෂ්පාදනය හා අලෙවිය සැසඳීමේදී නිෂ්පාදනයට සාපේක්ෂව අලෙවියක් දක්නට නොවීය. ඒ අනුව මාසික නිෂ්පාදනය තුළින් වැඩි පැල ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. වර්ෂය පුරා මාසික අලෙවිය සියයට 4 සිට සියයට 62 දක්වා පහළ අගයක් ගෙන තිබුණු අතර තොග ඉතිරිය සියයට 26.4 සිට 95 දක්වා ඉහළ අගයක් ගෙන තිබුණි. | • යම් මාසයකදී පැළ තවාන් තුල ස්ථාපිත කරනු ලබන ගස්ලබු බීජ, අලෙවිය සඳහා අවශ්‍ය ගුණාත්මක තත්ත්වයට පත්වීම සඳහා මසකට වඩා වැඩි කලක් ගතවන අතර එබැවින් එම බීජ සංස්ථාපනය කල මසට පසු මාසය අලෙවිය සඳහා යොමු කරනු ලැබේ. එමනිසා බීජ සංස්ථාපිත මාසය හා ඊට පසු එළැඹෙන මාසය සංසන්ධනය කල යුතුවේ.<br>• වර්ෂය පුරා මාසික අලෙවිය සැලකීමේදී ද ඉහත දක්වන ලද ක්‍රමවේදය අනුගමනය කරනු ලැබූ අතර එවිට මාසික අලෙවිය 23% සිට 100% දක්වා විචලා වී තිබිණි. |
| | <u>කළමණාකරණ ක්‍රියාකාරකම්</u><br><br>(අ) ආයතනය විසින් ගොවීන්ගේ භාරකාර අරමුදල හා ග්‍රාමීය ව්‍යවසාය වැඩසටහන යටතේ ණය වැඩසටහන් දෙකක් පවත්වා ගෙන යන අතර එම ණය මුදල් ප්‍රදානය කිරීමේදී ගොවීන් හා භාරකාර අරමුදල අතර විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. එම ණය මුදල් නැවත අයකර ගැනීමේ නිශ්චිත වූ ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන් ලබා දෙන ණය අයකර ගැනීම සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් පැන නැගී තිබුබව නිරීක්ෂණය විය. | මේ පිළිබඳ දැනුවත් කිරීම් ලිපි මඟින් කිහිප වතාවක්ම දැනුවත් කලද ඒ සඳහා ඔවුන්ගෙන් පැහැදිලි ප්‍රතිචාරයක් නොදැක්වූ අතර මේ සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදුකරමින් පවතී. |
| | (ආ) 2014 දෙසැම්බර් 26 දින ආයෝජනය කර තිබූ රු.10,120,895 ක් වටිනා ඉල්ලුම් තැන්පතුව 2018 සැප්තැම්බර් 21 විගණිත දිනය දක්වාම ආපසු ගෙන නොතිබුණු අතර ආයෝජනය කළ දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා ලැබී තිබුණු ආයෝජන ආදායම රු.1,067,546 ක් විය. මෙම මුදල ස්ථාවර තැන්පතුවක ආයෝජනය කළේ නම් දළ වශයෙන් ලබාගත හැකිව තිබුණු පොලී ආදායම රු.2,159,874 කි. ඒ අනුව ආයතනයට ආසන්න වශයෙන් රු.1,092,328 ක අවාසියක් සිදුව තිබූ බව නිරීක්ෂණය කෙරේ. | ඔබගේ නිරීක්ෂණය සමග එකග වෙමි. 2018 වර්ෂයේ දී එම සියලු මුදල් ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර ඇති බව දන්වා සිටිමි. |
| | <u>කාර්ය මණ්ඩල පුරප්පාඩු</u><br><br>(අ) 2017 වර්ෂයේ ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 26 ක් වන අතර තත්‍ය කාර්ය මණ්ඩලය නිලධාරීන් 08 ක් විය. ඒ අනුව සමස්ත කාර්ය මණ්ඩල ඌනතාවය 18 ක් වන අතර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු, කථිකාචාර්යවරුන් දෙදෙනෙකු හා තාවකාලික ශිල්ප ප්‍රදර්ශක (Temporary Demonstrators) එක් තනතුරක් ඌනතාවයක් පැවතුණි. | කථිකාචාර්යවරුන් 03දෙනෙකු බඳවා ගැනීමට 2017 වර්ෂය තුල දී සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබූ අතර දැනට 01ක් කථිකාචාර්යවරයෙකු බඳවා ගෙන ඇති අතර අනෙක් 02නා බඳවා ගැනීම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අනුමැතිය ලැබෙන තෙක් ප්‍රමාද වී ඇත. ඌනතාවයක් පවතින තාවකාලික ශිල්ප ප්‍රදර්ශක තනතුර ද 2018 ජනවාරි මස පුරවා ඇත. |

| | | |
|---|---|---|
| | | ආයතනයේ පැවරුම් සේවා පදනම මත සිටින කාර්ය මණ්ඩලය අමාත්‍ය මණ්ඩල සන්දේශයක් මගින් ස්ථිර කර ගැනීමට කටයුතු සිදු කර ඇති අතර එය අනුමත වීමෙන් පසුව, කාර්ය මණ්ඩල ඌනතාවයක් නොපවතිනු ඇත. |
| | (ආ) 2017 වර්ෂයේදී ආයතනය විසින් කාර්ය පැවරුම් පදනම මත සේවකයන් 55 දෙනෙකු සේවයේ යොදාගෙන තිබූ අතර එම සේවකයින් වසර 01 සිට වසර 18 ක් ආයතනයට සේවය කර තිබූ බව නිරීක්ෂණය විය. මේ සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගෙන තිබුණද කාර්ය මණ්ඩල අවශ්‍යතාවය සංශෝධනයකින් තොරව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් 41 ක් සේවයේ යොදවා තිබුණි. | කාර්ය මණ්ඩල අවශ්‍යතාවය සංශෝධනයක් 2015 වර්ෂයේ දී කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන් සිදු කල අතර එහි වාර්තාවක් 2017 වර්ෂය අවසන් වන තෙක් මෙම ආයතනය වෙත ලැබී නොමැත. අනුමත කාර්ය මණ්ඩලය කිසිසේත් උසස් අධ්‍යාපන ආයතනයක් සඳහා ප්‍රමාණවත් නොවන අතර ආයතනික කටයුතු පවත්වා ගෙන යාම සඳහා කායීය පැවරුම් පදනම මත කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත සේවකයින් බඳවා ගෙන ඇත්තේ එබැවිනි.<br><br>ආයතනයේ පැවරුම් සේවා පදනම මත සිටින කාර්ය මණ්ඩලය 47 දෙනකු අමාත්‍ය මණ්ඩල සන්දේශයක් මගින් ස්ථිර කර ගැනීමට කටයුතු සිදු කර ඇත. |
| | **<u>නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>**<br><br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නේවාසිකාගාර 60 ව්‍යාපෘතිය යටතේ රු.220,096,952 ක් වැයකර 2014 වර්ෂයේදී කාමර 100 කින් සමන්විත සිසුන් 400 කට නවාතැන් ගතහැකි නේවාසිකාගාරයක් ආයතනය තුළ ඉදිකර තිබූ අතර එය 2014 වර්ෂයේදී ආයතනනයට පවරා තිබුණි. 2017 වර්ෂයේ එක් එක් මාසය තුළ කාමර භාවිතය පරීක්ෂාවේදී භාවිතයට ගෙන තිබුණු උපරිම කාමර ගණන 32 ක් විය. දිනකට උපරීම වශයෙන් නේවාසිකව සිටි සිසුන් ගණන 77 ක් වූ අතර සිසුන් අඛණ්ඩව නේවාසිකව නොසිටින බව නිරීක්ෂණය විය. 2018සැප්තැම්බර් 28 විගණිතදිනයවන විටත්මෙමනේවාසිකාගාරය උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව භාවිතයට ගැනීමට ආයතනයට නොහැකි වී තිබුණි. | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නේවාසිකාගාර 60 ව්‍යාපෘතිය යටතේ, මෙම නේවාසිකාගාරය ඉදි කරන ලද්දේ තාක්ෂණික විෂය ධාරාව යටතේ ශිෂ්‍යයින් ඇතුලත් කර ගැනීම සඳහා වන අතර එය කොළඹ විශ්ව විද්‍යාලයට ලබා ගැනීම නිසා මෙම නේවාසිකාගාරය ඉදි කරන ලද අරමුණ සාක්ෂාත් කර ගැනීමට නොහැකි විය.<br><br>ආයතනයේ දැනට සිටිනුයේ කෘෂි තාක්ෂණික උපාධි පාඨමාලාව හදාරන සිසුන් වන අතර එම පාඨමාලාවේ සුවිශේෂත්වය වනුයේ දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය යටතේ (e-learning) පාඨමාලාව මෙහෙයවීමයි. එබැවින් එම සිසුන් ඔවුන්ගේ ප්‍රායෝගික පරීක්ෂණ, බාහිර දේශන (visiting lectures), ගොවිපළ පුහුණු පාඨමාලාව සහ විභාග කටයුතු සඳහා නේවාසිකව සිටින අතර වැඩි වශයෙන් සති අන්ත සහ නිවාඩු දින වලදී ය. දැනට ශිෂ්‍ය කණ්ඩායම් 9 ක් සිටින අතර බොහෝ සති අන්ත දින වල දී මෙම නේවාසිකාගාරයේ ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන අතර සිසුන්ට ඉතා අපහසුවෙන් නවාතැන් ගැනීමට සිදු වේ. 10 වන ශිෂ්‍ය කණ්ඩායමේ 300 කට ආසන්න ප්‍රමාණයක් 2018 නොවැම්බර් 06 දින ඇතුලත් කර ගන්නා අතර ආයතනයට නවාතැන් පහසුකම් සැපයීම පිලිබඳ ව දැඩි ගැටලුවකට මුහුණ දීමට ඉදිරියේ දී සිදු වේ.<br><br>මෙම නේවාසිකාගාරය ආයතනය තුල ඉදි කර නොතිබුනේ නම් ශිෂ්‍යයින් විසින් ඔවුන්ට නවාතැන් පහසුකම් සපයන ලෙස ඉල්ලා උද්ඝෝෂණ සිදු කරනු ඇත. එයට හේතුව යාපනය වැනි ඉතා දුර බැහැර ප්‍රදේශ වල සිට ශිෂ්‍යයින් මෙම පාඨමාලාව හැදෑරීම සඳහා පැමිණෙන අතර වැඩි සිසුන් ප්‍රමාණයක් සිටිනුයේ ඉතා දුර බැහැර ප්‍රදේශ වලින් වීමයි. |

| | | |
|---|---|---|
| 5 | තිරසාර සංවර්ධනය | |
| 5.1 | තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම | |
| | 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරණ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ‘‘න්‍යාය පත්‍රය‘‘ ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින් ම කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳ දැනුවත් වී නොතිබුණි. | 2017 වර්ෂය තුළ දී තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ‘‘න්‍යාය පත්‍රය‘‘ ප්‍රකාරව ආයතනයේ විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් නිසියාකාරව කටයුතු කර ඇත. න්‍යායාත්මකව පෙර හඳුනාගෙන නොමැති වුව ද කෘෂි තාක්ෂණයේ නියුතු ආයතනයක් ලෙස තිරසාර සංවර්ධන අරමුණු ඉටුවන ආකාරයෙන් කටයුතු කර ඇති බව පසු විපරම් කිරීමේ දී හඳුනාගෙන ඇත. |
| 6. | ගිණුම් කටයුතුභාවය හා යහපාලනය | |
| 6.1 | ප්‍රසම්පාදනය<br><br>(අ) සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණද ඒ සඳහා ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණ කළ යුතු දින වකවානු ඇතුළත් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. ඒ අනුව ප්‍රසම්පාදනයන් නිශ්චිතව හඳුනාගත නොහැකි වූ අතර සැලැස්ම සමග සැසඳීමට නොහැකි වීම සහ කාලසටහන ඇතුළත සම්පූර්ණ කර තිබූ බව විගණනයට තහවුරු කරගත නොහැකි විය. | ඔබගේ නිරීක්ෂණය සමග එකග වෙමි. 2018 වර්ෂය සඳහා  නියමිත කාල වකවානු ඇතුලත් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇති අතර ඒ අනුව ප්‍රසම්පාදනයන් සිදු කරනු ලැබේ. |
| | (ඇ) නියැදි පරීක්ෂාවේදී වටිනාකම රු.638,250 ක් වූ දේශන ශාලා සඳහා පුටු 75 ක් මිලදී ගැනීම අදාළ අංශයෙන් භාණ්ඩ ඉල්ලුම් කළ දිනයේ සිට සැපයුම්කරුගෙන් භාණ්ඩ ඇණවුම් කිරීම දක්වා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දින 125 ක කාලයක් ගත වී තිබුණු අතර රු.58,300 ක් වටිනා මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීමේදී ද මෙම ක්‍රියාවලිය සඳහා දින 202 ක පමණ කාලයක් ගතවී තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු වල ප්‍රමාදයන් පැවති  බව නිරීක්ෂණය විය. | ඔබගේ නිරීක්ෂණය සමග එකග වෙමි. 2018 වර්ෂය සඳහා  නියමිත කාල වකවානු ඇතුලත් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇති අතර ඒ අනුව ප්‍රසම්පාදනයන් සිදු කරනු ලැබේ. |
| 6.2 | අයවැය පාලනය<br>සමාලෝචිත වර්ෂයේ අයවැය හා තත්‍ය වියදම් සැසඳීමේදී අභ්‍යන්තර ඉපයූ ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 81.9 කින් අඩු වී තිබූ අතර වියදම් විෂයයන් 06 ක අයවැය ගත ප්‍රතිපාදනය ඉක්මවා සියයට 44 සිට සියයට 433 දක්වා වැය කර තිබූ බව නිරීක්ෂණය විය. | වියදම් විෂයන් හයක අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා වියදම වී ඇතැයි යන ප්‍රකාශය සමඟ එකඟ වන අතර එසේ කිරිමට සිදුවී ඇත්තේ ආයතනයේ සංවර්ධන කටයුතු ශීඝ්‍රයෙන් සිදුවීම නිසා ඊට අදාල වියදම් දැරිම සඳහාය.එකී වියදම් වලදී අයවැයගත ප්‍රතිපාදන මතම කටයුතු කිරීම ප්‍රයෝගිකව ඉතා අපහසුය.කෙසේ වෙතත් මීළඟ වසරේදී අයවැය සකස් කිරිමේදී මේ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කිරිමට |

| | | |
|---|---|---|
| | | කටයුතු කරනු ලැබේ. |
| **7.** | **පද්ධති හා පාලනයන්** | |
| | **(අ)පැල නිෂ්පාදනය සහ අලෙවිය**<br><br>අලෙවිය පිලිබඳව පුරෝකථන සිදුකර පැල නිෂ්පාදනය නොකිරිම, නිෂ්පාදනයන් සහ අලෙවිය සැලසුම් කර නොතිබීම, අනෙකුත් නිෂ්පාදනයන් සඳහා නිෂ්පාදන ගිණුම් සකස් කර නොතිබීම. | • පටක රෝපණ තාක්ෂණයේදී ඇතිවිය හැකි විකෘති ප්‍රමාණය 1-10%ක් විය හැකි අතර 2017 වර්ෂයේදී එම අගය 3% මට්ටමේ පවත්වා ගැනීමට හැකිවිය. එසේම මිය ගිය පැළ ප්‍රමාණයද 4.59% ප්‍රතිශතයක පවත්වා ගැනීමට හැකිවිය.<br>• 2017 වර්ෂය අවසානයේදී ඉතිරි වූ පැළ ප්‍රමාණය නිම් හා නොනිම් ලෙස ප්‍රධාන කොටස් 2කට බෙදනු ලබයි. එහිදී නොනිම් කාණ්ඩය සඳහා එම වසරේ දෙසැම්බර් මාසය තුලදී විද්‍යාගාර මගින් ලබා ගත් පැළ ප්‍රමාණය (පැළ 18,180) දක්වන අතර එම පැළ තොගය අලෙවි කිරීම සඳහා යෝග්‍ය වනුයේ 2018 වසරේ ජනවාරි මාසය වන විටදී වේ. එසේම නිම් ලෙස ඉතිරිවන පැළ 20,178 ක ප්‍රමාණයක් පැළ තවාන් ගෘහ තුල ඉතිරි වී තිබූ අතර එයින් කොටසක් නිකුත් කිරීමට සුදුසු ගුණාත්මක තත්ත්වයන් ලබාගන්නා තෙක් රඳවා ගැනීමට සිදු වූ අතර තවත් කොටසක් විකෘති පැළ හඳුනා ගැනීමට තවදුරටත් රඳවා ගැනීමට සිදුවිය. තවත් ප්‍රමාණයක් පැළ ඉල්ලුම් කරනු ලැබූ ගොවි මහතුන් පැළ නිකුත් කරනු ලැබූ දිනයන්හිදී නොපැමිණීම නිසා රඳවා තබා ගැනීමට සිදුවිය (පැළ නිකුත් කිරීමේදී ක්‍රමික අනුපිළිවෙලක් මත පමණක් පැළ නිකුත් කිරීම සිදු කරනු ලබන අතර දෙසැම්බර් මස සඳහා පැළ නිකුත් කිරීමට සුදුසුකම් ලැබූ ගොවි මහතුන් හට එම මාසය තුලදී පහසු දිනයකදී පැමිණීමට අවකාශ ලබාදී තිබේ).<br><br>නිෂ්පාදන ගිණුම සකස් කිරිමේදී සෑම මාසයකදීම එම මසට අදාල මාසික ගිණුම් වාර්ථා / ප්‍රගති වාර්ථා මූල්‍ය අංශය වෙත ලබාදී ඇති අතර 2017 වර්ෂය අවසානයේදී වාර්ෂික වාර්ථාවක් සකසා ගිණුම් අංශය වෙත ලබාදී ඇත. |
| | **(ආ)කාර්ය මණ්ඩල පරිපාලනය**<br><br>(i) කාර්ය මණ්ඩල අවශ්‍යතා අනුව අනුමත කාර්ය මණ්ඩල සංශෝධනය කර නොගැනීම සහ පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. | කාර්ය මණ්ඩල අවශ්‍යතාවය සංශෝධනයක් 2015 වර්ෂයේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් සිදු කල අතර එහි වාර්තාවක් 2017 වර්ෂය අවසන් වන තෙක් මෙම ආයතනය වෙත ලැබී නොමැත. අනුමත කාර්ය මණ්ඩලය කිසිසේත් උසස් අධ්‍යාපන ආයතනයක් සඳහා ප්‍රමාණවත් නොවේ.<br>ආයතනයේ පැවරුම් සේවා පදනම මත සිටින කාර්ය මණ්ඩලය 47 දෙනකු අමාත්‍ය |

| | | |
|---|---|---|
| | (ii) ආයතන නිලධාරින්ගේ පෞද්ගලික ලිපි ගොනු නිවැරදි තොරතුරු ඇතුලත් කර පවත්වා නොගැනිම. | මණ්ඩල සන්දේශයක් මගින් ස්ථිර කර ගැනීමට කටයුතු සිදු කර ඇති අතර එය අනුමත වීමෙන් පසුව සියලු පුරප්පාඩු පිරවෙනු ඇත.<br><br>වර්තමානය වන විට අවශ්‍ය තොරතුරු ඇතුලත් කර පෞද්ගලික ලිපි ගොනු පවත්වා ගෙන යනු ලැබේ. |
| | **(ඇ)තොග අගය කිරීම**<br><br>පැල තොග අගය කිරිමේ ප්‍රතිපත්තිය පිළිබඳව අවධානය යොමු නොකිරීම. | පෙර ගැනුම් පෙර නිකුත් කිරීමේ ක්‍රමය යටතේ තොග අගය කරන අතර මේ පිළිබඳ ගබඩා පාලක විසින් විගණන නිලධාරීන් හට දන්වා ඇත. |
| | **(ඇ)ණය පාලනය**<br><br>ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. | මේ වන විට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදුකරමින් පවතී. |